

# 1998
# ප්‍රගති වාර්තාව

---

# 1999
# ක්‍රියාත්මක සැලැස්ම

වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය.

MINISTRY OF FORESTRY & ENVIRONMENT
LIBRARY
07 SEP 2000

# 1998
# ප්‍රගති වාර්තාව

# 1999
# ක්‍රියාත්මක සැලැස්ම

MINISTRY OF FORESTRY & ENVIRONMENT
LIBRARY
07 SEP 2000

වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය
82, "සම්පත් පාය", රජ මල්වත්ත පාර, බත්තරමුල්ල.

**ප්‍රකාශය - වන සම්පත් හා පරිසර අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකය**

# ගරු වන සම්පත් හා පරිසර අමාත්‍යතුමාගේ පණිවිඩය

වන සම්පත් හා පරිසර අමාත්‍යාංශයේ කාර්ය භාරය, පරමාර්ථ, සංවිධාන ව්‍යුහය සහ 1998 තුන්වැනි කාර්තුව දක්වා ලබා ගන්නා ලද ප්‍රගතිය ද, 1999 වර්ෂය සඳහා කාර්ය සැලසුම් ද අන්තර්ගත වූ මේ ලේඛනය මා ඉදිරිපත් කරන්නේ මහත් සතුටිනි. වර්ෂ 1997 දී පිහිටුවන ලද මේ අලුත් අමාත්‍යාංශයට දැන් වසරක් ගත වී ඇති අතර, එම කාලය තුළදී අමාත්‍යාංශයේ අවශ්‍යතා සපුරා ලීම සඳහා නව සංවිධාන ව්‍යුහයක් අප විසින් සකසනු ලැබ ඇත.

පරිසරය ආරක්ෂා කිරීමත් ප්‍රවර්තනීය භාවිතය උදෙසා ස්වාභාවික සම්පත් කළමනාකරණය කිරීමත් රටේ ආර්ථික, පාරිසරික හා දේශපාලන ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් පරීක්ෂාකාරී ලෙස සැලසුම් කිරීම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් අනෙකුත් රේඛීය අමාත්‍යාංශ සහ ආයතන සමග ඉතා සමීපව කටයුතු කිරීමට මගේ අමාත්‍යාංශයට සිදුවී ඇත. එ බැවින්, මෙකී මෙහෙවරට අනුගතව මගේ අමාත්‍යාංශය සතුව ඇති කාර්ය භාරය පරිසර කළමනාකරණයට නායකත්වය ලබා දෙන එකක් වශයෙනුත් සංවර්ධනයට පාරිසරික කරුණු ඇතුළත් කිරීම පහසු කරවන එකක් වශයෙනුත් හඳුනා ගනු ලැබ තිබේ.

මෙය සිත්හි තබා ගනිමින්, මගේ අමාත්‍යාංශයේ මෙන්ම වෙනත් රේඛීය අමාත්‍යාංශවල සහ ප්‍රජාවගේ ද තිබෙන සම්පත් අපගේ ස්වාභාවික සම්පත් ප්‍රවර්තනීය ආකාරයෙන් එක්ව කළමනාකරණය කිරීම සඳහා ප්‍රයෝජනයට ගැනීමට ම විසින් කටයුතු පිළියෙල කරනු ලැබ ඇත. පරිසරයේ වැදගත් කමත් සංවර්ධන කටයුතු වල යෙදෙන අතරම පරිසරය ආරක්ෂා කරගන්නේ කෙසේද යන්නත් පිළිබඳව මහ ජනතාව දැනුවත් කිරීමට සහාය වීම පිණිසත් එය පහසු කරණු පිණිසත් පරිසර සංවර්ධන සහකාර වරුන් සහ පරිසර ආශ්‍රිත නිලධාරීන් ද පත්කරනු ලැබ ඇත.

වනාන්තර කළමනාකරණය සහ ආරක්ෂා කිරීම " විධාන සහ පාලන" ක්‍රම මගින් සහ ජනතාවගේ සහභාගීත්වයෙන් ද පමණක් සිදු කළ නොහැකි බව ඉතා ප්‍රකට කරුණකි. රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශය ද මෙහිලා බෙහෙවින් වැදගත් වේ. මහජනතාවගේ සහභාගීත්වයෙන් වන සම්පත් වැඩ සටහන් කීපයක් ම ක්‍රියාත්මක වෙමින් පවතී. වන වගා ප්‍රතිෂ්ඨාපනය සහ කළමනාකරණය සම්බන්ධයෙන් පෞද්ගලික අංශය සම්බන්ධ කර ගැනීම සඳහා ද කටයුතු ආරම්භ කොට තිබේ.

මගේ අමාත්‍යාංශයේ සියළුම සංවර්ධන වැඩ සටහන් උපදේශාත්මක ක්‍රියාවලිය තුළින් සකස් කරණු ලැබ ඇති අතර, එහිදී අදාල සියළු දෙනාගේ ම අදහස් සැලකිල්ලට ගන්නා ලදි. ඉදිරියේදි ද මේ ක්‍රියාවලිය එ ලෙස ම කරගෙන යාමට මම බලාපොරොත්තු වෙමි.

අපගේ කාර්ය සාධනය වැඩිදියුණුකරගැනීම පිණිස, මේ ලේඛනයේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් පරිසරය ගැන උනන්දුවක් දක්වන අයගේ අදහස් සලකා බැලීමට මම කැමැත්තෙමි.

*නන්දිමිත්‍ර ඒකනායක*
වන සම්පත් හා පරිසර අමාත්‍ය.

# ගරු වන සම්පත් හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය

1998 වර්ෂයේ මේ අමාත්‍යාංශයේ කාර්ය සාධනයත් 1999 වසර සඳහා වූ යෝජිත කාර්ය සැලැස්මත් නිරූපණය කෙරෙන මේ වැදගත් ලේඛනය ඉදිරිපත් කිරීමෙහි ලා ගරු අමාත්‍යතුමා සමග එක්වීම ගැන සතුටු වෙමි.

මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා ආර්ථික සංවර්ධනය ලඟාකරගන්නා අතරම, අපගේ පරිසරය ද ආරක්ෂාකර ගැනීම ඉතා වැදගත් වේ. මෙය දුෂ්කර කාර්යයක් වන නමුදු, එය ඉටු කර ගත යුතු කාර්යයක් වේ. සංවර්ධන කාර්යයන් තුළට පාරිසරික කරුණු ඇතුළත්කිරීම පිණිස මහජනතාවගේ සහභාගීත්වය ඇතුව අදාල ආයතන සමග සාකච්ඡාකොට අප අමාත්‍යාංශය අවශ්‍ය උපායමාර්ග, සැළසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති සකස්කර ඇත.

වන සම්පත් අංශයෙහිලා, වන වැස්ම වැඩිකිරීම සඳහා පෞද්ගලික අංශයේ ආයෝජනය සහිතව මේ වසර තුළදී වැවිලි ස්ථාපන වැඩසටහන් හඳුන්වාදෙනු ලැබ ඇති අතර 1999 වසර තුළදී මේ වැඩ සටහන ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කෙරේ. ගස් වැවීමෙන් වැව් ඉවුරු පෙදෙස් සංරක්ෂණය කිරීම සහ වැව් ආරක්ෂා කිරීම සහතිකවෙනවා පමණක් නොව බෙහෙවින් අවශ්‍යවන වන වැස්මද වැඩි කරනු ඇත. මේ වසරේදී අමාත්‍යාංශය විසින් මෙකී කාර්යය සම්බන්ධයෙන් වැඩ සටහනක් දියත් කර ඇති අතර, ඊලඟ වසරේදී එය ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කෙරේ. 1999 දී මහජනතාවගේ සහභාගීත්වය ඇතිව මේ හා සමාන වෙනත් වැඩ සටහන් ද ක්‍රියාත්මකකිරීමට බලාපොරොත්තු වේ.

අනාගතයේදී අපගේ කාර්‍ය සාධනය වැඩි දියුණු කර ගැනීම සඳහා මේ ලේඛනයේ ඇතුළත් කරුණු සම්බන්ධයෙන් නිර්මාණාත්මක යෝජනා සතුටින් පිළිගනු ලබන අතර, එය යහපත් පරිසරයක් උදෙසා කෙරෙන සේවාවක් වශයෙන් ද සලකමි.

*මුනිදාස ප්‍රේමචන්ද්‍ර*

වන සම්පත් හා පරිසර නියෝජ්‍ය අමාත්‍ය.

# පූර්විකාව

පරිසර විෂයයට සම්බන්ධව මෑතකදී සිදුවූ සංවර්ධන දෙකක් වන සම්පත් හා පරිසර සංරක්ෂණය පිළිබඳ අපගේ ප්‍රවේශයේ ප්‍රධාන වෙනසකට විශාල වශයෙන් දායක වී ඇත. ඉන් පළමු වැන්න නම් වන සම්පත් හා පරිසරය යන විෂයයන් එක් අමාත්‍යාංශයක් යටතේ සම්බන්ධ කිරීමට අති ගරු ජනාධිපතිතුමිය තීරණය කිරීම වන අතර, දෙවැන්න වනුයේ අමාත්‍යාංශය සඳහා මෙහෙවර ප්‍රකාශයක් සකස් කිරීමය. මොළය වෙහෙසකරවන සැසි වාර මාලාවකින් අනතුරුව මෙකී මෙහෙවර ප්‍රකාශය අවසන් වරට තීරණය කරන ලද අතර, ප්‍රවර්තනීය සංවර්ධන මාවතෙහි ගමන් කිරීම උදෙසා වන සම්පත් හා පාරිසරික කළමනාකරණය පිළබඳ නායකත්ව කාර්ය භාරයක් එමගින් අමාත්‍යාංශයට පැවරුනි.

ප්‍රවර්තනීය සංවර්ධනය සඳහා වු වැඩ සටහනෙහි වන සම්පත් හා පරිසරය එකිනෙකෙන් වෙන් කළ නොහැකි උපාංගයන් වන බැවින්, උපදේශමය වැඩ පිළිවෙලවල් මාලාවක් සැකසීමට හැකි වු අතර, මේ නිසා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන්ට ද ක්ෂේත්‍ර මට්ටමේ දී එක්ව වැඩ කිරීමට හැකි විය.

ජාත්‍යන්තර ප්‍රජාව, වන සම්පත් හා පරිසර කළමනාකරණය දෙස බලන්නේ පුළුල් අනුදර්ශනයක් තුළිනි. වන සම්පත් හා පරිසරය අනෙකුත් සංවර්ධන අංශ කෙරෙන් වෙන් කොට සැලකිය නොහැකි බැව් දැන් වැඩි වැඩියෙන් පිළිගනු ලැබ ඇත. ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව පමණක් නොව දිළිඳු බව හා විරැකියාව ආදී සමාජීය හා ආර්ථික කරුණු ද සැලකිල්ලට ගනිමින් වනසම්පත් හා පරිසර කළමනාකරණය වෙත සාකල්‍ය ප්‍රවේශයක අවශ්‍යතාව අමාත්‍යාංශය විසින් පිළිගනු ලැබ ඇත. සංවර්ධන අවශ්‍යතා සහ පාරිසරික කරුණු ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාව අමාත්‍යාංශය විසින් දැඩිව අවධාරණය කරනු ලැබ ඇති අතර, මේ කාරණය ගැන ක්‍රියා කර ගෙන යාමේදී අනෙකුත් අමාත්‍යාංශවල ලේකම් වරුන් ද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ද සමග අන්‍යෝන්‍ය කාර්ය ගණනාවක් අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලැබ ඇත. පරිසරයේ පරම සතුරා දුප්පත් කම බැව් අමාත්‍යාංශය පිළිගෙන ඇත.

තවද සංවර්ධන ක්‍රියාවලියේ යම් පසු බෑමක් වෙතොත් එය පරිසරයටද හානිකර විය හැකි හෙයින්, රාජ්‍ය අංශයේ ආයතනවල පමණක් නොව, පෞද්ගලික අංශයේ මණ්ඩලවල සහ රාජ්‍ය නොවන සංවිධානවල ද අදහස් ලබා ගෙන සමබර ප්‍රවේශයක් අපි සකසා ඇත්තෙමු.

එසේම, පරිසරය හා සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රඥප්ති කෙරෙහි අමාත්‍යාංශය දැඩි අවධානයක් දක්වයි. එය ප්‍රධාන ප්‍රඥප්ති හතරක කේන්ද්‍ර ස්ථානය වන අතර ජාත්‍යන්තර ප්‍රඥප්ති යටතේ ඇති කරණ ලද බැඳීම් සම්බන්ධයෙන් ගත යුතු ස්ථාවරය කුමක් ද යන්න ගැන රජයට උපදෙස් දීම පිළිබඳ එය ප්‍රධාන කාර්ය භාරයක් දරයි. ප්‍රඥප්තිවල පාරිසරික අංශය පමණක් නොව ආර්ථික හා දේශපාලනමය අංශ ද මගින් රටේ අයිතිවාසිකම් ආරක්ෂා විය යුතු බවට අපි සැලකිලිමත් වෙමු.

ඉහත සඳහන් කරුණු ඇතුළත් කරමින් අමාත්‍යාංශය විසින් ජාතික පාරිසරික ක්‍රියාත්මක සැලැස්ම සම්පාදනය කරනු ලැබ ඇත. මේ ක්‍රියාවලට සහභාගී වීම සඳහා රාජ්‍ය අංශයට ද පෞද්ගලික අංශයට ද රාජ්‍ය නොවන ආයතන වලට ද පුළුල් අවස්ථා ලබා දෙමින් ඉහළ උපදේශාත්මක ක්‍රියාවලියක් තුළින් එය නිම කරණු ලැබ ඇත. පරිසර ආරක්ෂණ වැඩ සටහන් අනෙක් සංවර්ධන වැඩ සටහන්වලට විරුද්ධ නොවන බවට සහතිකවීම සඳහා මෙම සැලැස්මෙන් සෑම උත්සාහයක් ම දරා ඇත. වර්තමාන හා අනාගත පරම්පරාවල යහපත සඳහා ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීමට තමන් සතු වගකීම ගැන අමාත්‍යාංශය සැලකිලිමත් වේ.

එම පරමාර්ථය මුදුන් පත් කර ගැනීම සඳහා අමාත්‍යාංශය උපායමාර්ග ගණනාවක් යොදා ඇති අතර, එහිලා විශේෂයෙන් ම වන සම්පත් හා පාරිසරික සම්පත් කළමනාකරණය කිරීමේ වගකීම අනාගතයේ දී උසුලන පාසල් සිසුන්ද ඇතුළු තරුණ පරපුරේ අධ්‍යාපනය කෙරෙහි එය දැඩි අවධානයක් දක්වා ඇත.

වන සම්පත් හා පරිසර අමාත්‍යාංශයේ

# මෙහෙවර ප්‍රකාශය

වර්තමාන හා අනාගත

පරම්පරාවේ ශුභ සිද්ධිය

සඳහා ධරණීය සංවර්ධනය

ඇතිකිරීම අරමුණු කරගත්,

ජාතික කැපවීම සහතිකකරනු වස්,

පරිසර කළමනාකරණයට

නායකත්වය ලබාදීම, වන සම්පත්


හා පරිසර අමාත්‍යාංශයේ

මෙහෙවර වේ.

# වන සම්පත් හා පරිසර අමාත්‍යාංශයේ පරමාර්ථ

- ප්‍රවර්තනීය සංවර්ධනය උදෙසා ජාතික ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම, සංවර්ධනය කිරීම සහ සමාලෝචනය කිරීම.
- ජාතික පරිසර ප්‍රතිපත්තිය විස්තාරණය කිරීමට අනුබල දීම සඳහා කාර්ය පර්යේෂණ ආරම්භ කිරීම.
- ප්‍රතිපත්ති පරතර හඳුනා ගැනීම සහ අංශීය පාරිසරික ප්‍රතිපත්ති සංවර්ධනය පහසුකිරීම.
- නියාමක සැකැස්ම සඳහා ව්‍යාවස්ථාමය අනුග්‍රහය ලබා දීම.
- ජාතික ප්‍රතිචාරය සම්බන්ධීකරණය කිරීම සහ ජාත්‍යන්තර පාරිසරික ප්‍රඥප්ති වලට සම්බන්ධවීම
- ජාතික පාරිසරික දත්ත සහ තොරතුරු එකතු කිරීම, ගබඩා කිරීම, අළුත් කිරීම, සහ විසුරුවාහැරීම.
- පාරිසරික දැනුවත් බව ප්‍රවර්ධනයකිරීම.
- ප්‍රවර්තනීය සංවර්ධනය සඳහා ජාතික හා උප ජාතික මට්ටමින් ධාරිතා හා ආයතනමය වර්ධනය.
- ජාතික හා උප ජාතික මට්ටමින් රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන පුහුණුකිරීම.

## සංවිධාන ව්‍යුහය - වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය.



# පටුන

පිටුව

## වන සම්පත්


වන සම්පත් සංවර්ධන අංශය 01

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව 03

රාජ්‍ය දැව සංස්ථාව 06


## පරිසරය


ජාතික පාරිසරික ක්‍රියාත්මක සැලැස්ම 11

පරිසර දූෂණ පාලනය 12

ජෛව විවිධත්ව ඒකකය 15

නොරාඩ් පාරිසරික සහයෝගීතා වැඩ සටහන 17

ප්‍රථම පාරිසරික ක්‍රියාත්මක සැලැස්ම 19

මොන්ට්‍රියෙල් සන්ධාන ඒකකය 23

ඉහළ ජලාධාර කළමනාකරණ ව්‍යාපෘතිය 25

පරිසර ප්‍රවර්ධන ඒකකය 27


## මධ්‍යම පරිසර අධිකාරිය


පරිසර සංරක්ෂණ අංශය 29

ස්වාභාවික සම්පත් කළමනාකරණ අංශය 30

පරිසර ප්‍රවර්ධන අංශය 33


# වන සම්පත්

මධ්‍යම රජයේ විෂයයක් වූ "වන සම්පත්" පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනයේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා වූ සියළුම කටයුතු වන සම්පත් හා පරිසර අමාත්‍යාංශයේ වන සම්පත් අංශයෙන් සම්බන්ධීකරණය කෙරේ.

මහ වන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ මූලික ප්‍රතිපත්ති හා නීති සම්පාදනය. වන සම්පත් සංවර්ධන අංශය මගින්ද, වන වගා ඇති කිරීම, වන කළමනාකරණය හා නඩත්තුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින්ද, දැව නිෂ්පාදනය, අලෙවිය හා බෙදාහැරීම රාජ්‍ය දැව සංස්ථාව මගින්ද සිදු කෙරේ.

මෙයට අමතරව වන ක්ෂේත්‍රය හා සම්බන්ධ අනෙකුත් ව්‍යාපෘති ඉහත කී අංශ වල ඒකාබද්ධතාවයෙන් හා සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක කෙරේ.

# වන සම්පත් සංවර්ධන අංශය



වන සම්පත් සංවර්ධනය පිළිබඳ සියළු කටයුතුවල මුලස්ථානය ලෙස ක්‍රියා කරන්නේ වන සම්පත් සංවර්ධන අංශය (FDD) යි. එය, වන සම්පත් සංවර්ධන කටයුතුවල යෙදී සිටින පෞද්ගලික අංශයට, පාරිසරික ප්‍රශ්න පිළිබඳව උනන්දුවක් දක්වන රජයේ නොවන සංවිධාන වලට, මේ රටේ වන සම්පත් අංශයට ආධාර කිරීමට වුවමනාවක් තිබෙන ත්‍යාගශීලී නියෝජිතායතන වලට සහ මහජනයාට මග පෙන්වමින් මේ රටේ වන සම්පත් අංශයේ සංවර්ධනය සඳහා වන උත්පාදනයන් ඒකාබද්ධ කිරීමේ යෙදී සිටී.

## වන සම්පත් සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යයන්

- ප්‍රතිපත්ති සමාලෝචනය සහ සැකසීම,
- ආධාර ලබා ගැනීමට ක්‍රියා කිරීම
- වන සම්පත් සහ ඒ හා සම්බන්ධ කටයුතු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය ඉටු කිරීම
- වෙනත් සහය වීම.

වන සම්පත් සංවර්ධන අංශය 1995 වන මහ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ආධාර ලබා ගැනීමට උපකාර විය. 1995 ජාතික වන සම්පත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන ප්‍රතිපත්ති නිර්දේශ සමහරක් ක්‍රියාවට නැංවීමට ඒ මගින් බොහෝ පියවර ගැනිණ.

වන සම්පත් අංශයේ පස් අවුරුදු වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ දී ආධාර දීමට උනන්දුවක් දක්වන බොහෝ ආයතන සමග මේ කාල සීමාව තුළ සාකච්ඡා ගණනාවක් පැවැත්විණ. මේ සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් මේ වසර අවසන දී ව්‍යාපෘති සූදානම් කිරීමේ මෙහෙයක් සඳහා ආධාර දීමට ආසියා සංවර්ධන බැංකුව එකඟ විය. මෙහෙය 1998 නොවැම්බර මැද අරඹා 1999 මැයි මස අවසන් වනු ඇත.

ආසියා සංවර්ධන බැංකුව ආධාර සපයන ව්‍යාපෘතියක් මෙහෙය විසින් පිළියෙළ කරනු ඇත. ආසියානු සංවර්ධන බැංකුව හැරුණු විට තවත් ආධාර අවශ්‍ය බොහෝ කටයුතුවලට ආධාර දීමට උනන්දුවක් තිබෙන ආයතන ඒ බව පෙන්වා තිබේ.

## අනාගතයේ දී පිහිටුවන ව්‍යාපෘති වලට අයත් වන ප්‍රධාන අංශ නම්:

කැලෑ ඉඩම් වෙන් කිරීම සහ කළාපවලට බෙදීම.

වන සංරක්ෂණ හා කළමනාකරණය

ස්වාභාවික වනාන්තර බහු ප්‍රයෝජනය පිණිස කළමනාකරණය.

වෙළෙඳ වගා සංවර්ධනය,

සමාජ කෘෂි වන වගාව සහ ව්‍යාප්තිය,

වනය පදනම් කරගත් කර්මාන්ත සහ ආයතන සංවර්ධනය යි.

වන සම්පත් කළමනාකරණය නම් නව ව්‍යාපෘතිය ආයතන ශක්තිමත් කිරීම සහ හැකියාව ගොඩ නැංවීම සහ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ඇත. යොදා ගෙන තිබෙන වන සම්පත් වැඩ සටහන් අවහිරයෙන් තොරව ක්‍රියාත්මක කිරීමට එය ඉතාමත් අවශ්‍ය ය. 2000 වසරෙහි දී නව ව්‍යාපෘතියක් ඇරැඹීම බොහෝ සෙයින් සිදු විය හැකිය.


ශ්‍රී ලංකාවේ තෝරාගත් නිවර්තන වර්ෂා වනාන්තර සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ ව්‍යාපෘතියක් සඳහා නෙදර්ලන්ත රජය සමග සාකච්ඡා පැවැත් විණ. මේ වසර මුලදී ව්‍යාපෘතියක් පිළියෙළ කිරීමේ අදහසින් මෙහි පැමිණි නියෝජිත පිරිසක් අමාත්‍යාංශයේ සහ වන රක්ෂණ දෙපාර්තමේන්තුවේ උපදෙස් සහිතව මේ සඳහා ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කළහ. මේ ව්‍යාපෘතිය ළඟදී අරඹනු ඇත.


ආසියානු සංවර්ධන බැංකුව ආධාර කරන ඉහළ ජලාධාර කළමනාකරණ ව්‍යාපෘතිය (UWMP), ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු පත්කිරීම සමග ඇරැඹිණ. ප්‍රධාන පදවි වලට නිලධාරීන් පත්කිරීමට අමතරව උපකරණ ද ව්‍යාපෘතියට අවශ්‍ය වෙනත් පහසුකම් ද

ලබාගෙන තිබේ. කොළඹ පිහිටුවා ගත් ප්‍රධාන ව්‍යාපෘති කාර්යාලයට අමතරව ක්ෂේත්‍ර කාර්යාල දෙකක් බලන්ගොඩ සහ බණ්ඩාරවෙල පිහිටුවා ගැනිණ. නව ප්‍රතිපත්ති වෙනස්වීම් සහ ක්‍රියාත්මක වීමට නියමිත නොයෙක් වන සම්පත් වැඩසටහන් ක්‍රියාවට පත්කිරීම පිණිස දැනට තිබෙන වන සම්පත් ව්‍යවස්ථා වෙනුවට නව පනතක් අවශ්‍ය ය. කැබිනට් මණ්ඩලය පත්කළ ජාතික කාර්ය සාධක මණ්ඩලයට (NTF) වන සංක්ෂණ කෙටුම් පතක් සකස් කළ හැකි විය. එය බොහෝ කමිටු රැස්වීම්වල සාකච්ඡාවට භාජනය වී මහජන විවේචන ද ලැබීය. ඉන් පසු මුල් කෙටුම්පතට සංශෝධන ගණනාවක් කැරිණ. එසේ වුයේ කෙටුම්පතේ තත්ත්වය වැඩි දියුණු කිරීමට ය. ළග දී කෙටුම්පත රජයේ අනුමතිය පිණිස ඉදිරිපත් කිරීමට නියමිතය.

නව වන සම්පත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය ප්‍රතිපත්තිමය තීරණ ගණනාවක් ගෙන තිබේ. මේ ප්‍රතිපත්ති තීරණ කීපයක් දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී. ගත් තීරණවලින් සමහරක් නම්, වන වතු වගාවෙහිදී ග්‍රාමීය ප්‍රජාව ඇතුළු රජයේ - නොවන අංශය යොදවා ගැනීම, අපනයන සංවර්ධන මන්ඩලයට අයත් සමාගම් වලට දුම්මල ලබා ගැනීමට පයින් වතු බදු දීම, වන වතු වගා කළමනාකරණයට රජයේ නොවන අංශයේ සහභාගීත්වය ලබාගැනීම, ගෙවතු වලින් ගස් මිළදී ගැනිමේ ක්‍රමය හා රාජ්‍ය දැව සංස්ථාවේ කටයුතු පුළුල් කිරීම යනාදියයි.

1999 වසරේදී නව වන සම්පත් ව්‍යාපෘතියක් සැකසීම නිම වී එයට මුදල් ලබා ගැනීමට ආධාර සපයන නියෝජිතායතන සමග කරන සාකච්ඡා අවසන් වනු ඇත. එවිට නව ව්‍යාපෘතිය 2000 වසරේදී ආරම්භ කිරීමට පුළුවන. ඉහළ ජලාධාර ප්‍රදේශ කළමනාකරණ ව්‍යාපෘතිය (UWMP) සම්පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම 1999 දී සිදුවේ. මේ සියළු කටයුතු සම්බන්ධීකරණය කරමින්, අවශ්‍ය මාර්ගෝපදේශ සපයමින් සියළු කටයුතු සමීපව නිරීක්ෂණය කරමින් අමාත්‍යාංශය ඉමහත් මෙහෙයක් ඉටු කරණු ඇත.



# වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

රටේ වන සම්පත් කළමනාකරණය හා උපයෝගීතාව පිළිබඳව කාර්යයන් සම්බන්ධයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට බලය පැවරී ඇති අතර, ඒ තුළින් වන සම්පත් ක්ෂේත්‍රය ඇතුළත වූ විවිධ අංශවල අවශ්‍යතා සපුරාලීම සඳහා කටයුතු රැසක් එය ක්‍රියාත්මක කරයි. මෙකී විවිධ කටයුතු,

(අ) වන වගා පිහිටුවීම.

(ආ) වගා කිරීම සඳහා ප්‍රචාරණය ලබා දීමේ වැඩ සටහන්.

(ඇ) වන වගා පර්යේෂණ

(ඈ) වන භාණ්ඩ ලේඛන හා කලමනාකරණය.

(ඉ) වන ආරක්ෂාව සහ නීති ක්‍රියාවේ යෙදවීම.

(ඊ) පාරිසරික කලමනාකරණය.

(උ) වන වගා ව්‍යාප්තිය හා අධ්‍යාපනය

යනුවෙන් සම්පිණ්ඩනය කළ හැකිවේ.


ඉහත කී කටයුතු සැලසුම් කිරීම හා නිරීක්ෂණය කිරීම සඳහා දෙපාර්තමේන්තුව කාර්යමය තාක්ෂණික අංශ හයකින් යුක්ත වන අතර, ක්ෂේත්‍ර මට්ටමේ දී මෙකී කටයුතු වන අංශ 18 කින් ක්‍රියාත්මක වේ. බොහෝ අංශ වල භෞමික සීමාව පරිපාලන දිස්ත්‍රික්කය හා සමානවේ. මෙකී වන අංශ 18 අඩවි 72 කින් සමන්විත වන අතර, එකී අඩවි සංඛ්‍යාව බිට්ටු නමින් හැඳින්වේන කුඩා පරිපාලන ඒකක 361 කට නැවත බෙදී ඇත. ඒ සියළු මට්ටම් වලදී වෘත්තීය වන නිළධාරීන් සහ මධ්‍යම මට්ටමේ වන තාක්ෂණ ශිල්පීන් කාර්යාලවලට පත්කොට ඇත.

## 1998 වසරේ කාර්‍ය සාධනය සහ 1999 ක්‍රියාත්මක සැළැස්ම

### වන වගා පිහිටුවීම හා වගා පවත්වාගෙන යෑම.

රටේ හොඳ තත්ත්වයේ වන වැස්ම වැඩිකිරීමේ පුළුල් පරමාර්ථයෙන් යුතුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වන වගා පිහිටුවයි. පහත සඳහන් ඝන වලට අයත් වන වගාවන් දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබයි.

- කාර්මික ප්‍රයෝජනය සඳහා කට්ටි වගාවන් පිහිටුවීම



- පාරිසරික හේතු කරණ කොටගෙන ඇතිකරණ ආරක්ෂිත වගා
- පයිනස් වගාවන් වෙනුවට පලල් පත්‍ර විශේෂයන් වගාකිරීම.
- ගෙවතු සංවර්ධනය
- ගොවීන්ගේ සහභාගීත්වය ඇතිව දැව බිම් ඇති කිරීම
- මාර්ග දෙපස හා ගංඉවුරු දෙපස රුක් රෝපණය වැනි විවිධ රෝපණ කටයුතු

ඉහත වැඩ සටහන යටතේ මේ වසරේ හතරවැනි කාර්තුවට පෙර හෙක්ටයාර් 504 ක වන වගා ඇතිකරනු ලබනවා ඇත. ඉතා බහුල වශයෙන් වවනු ලබන වෘක්ෂ විශේෂ වනුයේ මැහෝගනී, තේක්ක, කොහොඹ, බයා, හල්මිල්ල, ගොඩකිරිල්ල, ඇකේෂියා විශේෂ, කැෂුවරිනා විශේෂ, ඉයුකැලිප්ටස් විශේෂ වේල් හා වෙනත් දේශීය ගස් විශේෂ ද වේ.

1999 දී හෙක්ටයාර් 5000 ක් අළුතින් වගාකිරීමට සැලසුම් කරනු ලැබ ඇත.

අළුත් වැවිලි හොඳින් වැඩීම සහතික වනු සඳහා පසුගිය වසර තුන තුළදී ඇති කරන ලද වන වගාවන් දෙපාර්තමේන්තුව විසින් සිරිත් පරිදි පවත්වාගෙන යනු ලැබේ. මේ අනුව මේ වසරේදී මෙතෙක් හෙක්ටයාර් 2861 ක වගාවන් පවත්වාගෙන යන ලදි. 1999 දී හෙක්ටයාර් 3896 ක ලපටි වගාවන් පවත්වා ගැනීමට සැලසුම් කරනු ලැබ ඇත.

### තවාන් වැඩ සටහන.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද විවිධ රෝපණ වැඩසටහන් සඳහා අවශ්‍ය කෙරෙන බීජ පැල දෙපාර්තමේන්තු පැල තවාන්, පෞද්ගලික පැල තවාන්, ගොවිජනසේවා සහ රාජ්‍ය නොවන ආයතනවල පැල තවාන් යන ගණවලට අයත්වූ රටේ ඇති පැල තවාන් ජාලයෙන් ලබාගැනේ.

ඉහත කී ගණවලට අයත් පැල තවාන් වලින් මේ වසරේ දී ලබාගන්නා ලද බීජ පැල නිෂ්පාදනය දශලක්ෂ 10 ක් පමණ වේ.

වර්ෂ 1999 දී තවත් බීජ පැල දශලක්ෂ 10 ක් ලබාගැනීමට සැලසුම් කරනු ලැබ ඇත.

## වන වගා පර්යේෂණ.

ජාතික ප්‍රමුඛතාවන් අනුගමනය කරමින් ක්ෂේත්‍ර කාර්යමණ්ඩල හා අනෙකුත් ආන්තික භාවිතා කරුවන් අතර ප්‍රයෝජනවත් පර්යේෂණ සොයාගැනීම් බෙදාහැරීමෙන් ද තාක්ෂණික උපදේශක සේවා ලබාදෙමින් ද ජාතික වන වගා සංවර්ධන වැඩ සටහනට තාක්ෂණික අනුග්‍රහය ලබා දීමේ ප්‍රධාන අරමුණ ඇතිව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පර්යේෂණ කටයුතු සිදුකරයි.

වන වගා පර්යේෂණ මහා සැලැස්ම ක්‍රියාත්මක කිරීමත් ශ්‍රී ලංකාව තුළ වන වගා පර්යේෂණ කටයුතු සිදුකරන වෙනත් ආයතන සමග සම්බන්ධීකරණ වන වගා පර්යේෂණ සිදු කරන ජාත්‍යන්තර ආයතන සමග සම්බන්ධතා පැවැත්වීමත් වන වගා තොරතුරු කළමනාකරණයත් පර්යේෂණ යෝජනා සමාලෝචනය කිරීම සඳහා ජාතික වන වගා පර්යේෂණ කමිටුවට සහයවීමත් වර්ෂ 1998 තුළදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන කටයුතුවලට අයත්වේ.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පර්යේෂණ මධ්‍යස්ථාන දෙකක් ක්‍රියාත්මක කරයි. එයින් එකක් කුරුණෑගල ද අනෙක බදුල්ලේ ද ඇත.

වර්ෂ 1999 සඳහා සැලසුම් කරණ ලද කටයුතුවලට දැව භාවිතා පර්යේෂණ සඳහා රසායනාගාර පිහිටුවීම දැව හා දැව ඉරණ මෝලක් ද දැව වැඩ කරන වැඩ පලක් ද දැව පදම් කරන යන්ත්‍රාගාරයක් ද පිහිටුවීම ඇතුළත්වේ. මීට අමතරව දැව ආදර්ශ සංචිතයක් ප්‍රතිෂ්ඨාපනය කිරීමද 1999 වැඩ සටහනට අයත්වේ.

## වන ආරක්ෂණය හා නීති ක්‍රියාවේ යෙදීම.

වන ආරක්ෂණයේ හා නීති ක්‍රියාවේ යෙදීමේ පරමාර්ථය වනුයේ වන වගාවන්, වන ජීවීන් හා වෙනත් ජෛව විවිධත්ව සම්පත් ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම වේ. මේ කාරණය සපුරාගැනීමෙහිලා ප්‍රධාන වන වැරදි අල්ලා ගැනීම සඳහා කලාපීය හදිසි වැටලීම් ඒකක සහ ප්‍රධාන කාර්යාල හදිසි වැටලීම් ඒකකද යොදවන ලද අතර පැය 24 පුරා ක්‍රියාත්මක වෙමින් දැව ප්‍රවාහනය කෙරෙන ලොරි පරීක්ෂාකෙරෙන දැව පරීක්ෂාකිරීමේ මධ්‍යස්ථාන ජාලයක් ද ඇති කරණ ලදී.

පසුගිය මාස 10 ක කාල සීමාව තුළදී වන වැරදි වැටලීමේ සාමාන්‍ය කටයුතු වලට අමතරව මුද්‍රා තැබීමේ මිටි 837 ක් ද දෙපාර්තමේන්තුවේ ආරක්ෂණ ශක්තිය තර කිරීම සඳහා තුවක්කු 50 ක් හා පිස්තෝල 10 ක්ද ලබාගැනීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත. ක්ෂේත්‍රයත් මූලස්ථානයත් අතර පනිවිඩ හුවමාරුකරගැනීම පහසු කරගනිමින් දැනට ක්‍රියාත්මක වන සංනිවේදන පද්ධතිය 1998 වර්ෂය තුළදී පවත්වාගෙන යන ලදී.

දෙපාර්තමේන්තුවේ ආරක්ෂණ ශක්තිය දියුණු කිරීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් දැනට තිබෙන ව්‍යවස්ථා සමාලෝචනය කොට වර්ෂ 1999 දී නව ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇත. නීති ක්‍රියාවේ යෙදීමේ උප ව්‍යුහය දියුනු කිරීමේ සැලසුම් ගත ක්‍රියා මාර්ග හදිසි වැටලීම් ඒකක සඳහා ජීප් රථ හා යතුරු පැදි ලබාගැනීම ද ඊට ඇතුළත් වේ.

## වන ලේඛණ සහ කළමනාකරණය.

දිවයිනේ වන සම්පත් ප්‍රවර්තනීය ලෙස කළමනාකරණය කිරීම වන ලේඛණ හා කලමනාකරණ කටයුතුවලට අයත් වේ. මේ ක්ෂේත්‍රය යටතේ එන ප්‍රධාන කටයුතු වලට දිවයිනේ වන සම්පත් සිතියම් ගත කිරීමත් රුක් වැවීමේ හා රැක බලා ගැනීමේ විද්‍යාවට අයත් ප්‍රතිකර්ම හා ලේඛණ සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නිරීක්ෂණය කිරීමත් වනසම්පත් දත්ත පදනම් කළමනාකරණයත් රාජ්‍ය දැව සංස්ථාව සමග සම්බන්ධීකරණය ඇති කරුණු පිළිබඳව තීරණගැනීමත් ඔලියෝ-රෙසින් ලබා ගැනීම සඳහා පයිනස් වගාව බදු දීමත් ඇතුළත් වේ.

මේ වසරේ පසුගිය මාස 10 ඇතුළතදී හෙක්ටයාර් 307ක වගාවන් වාණිජ තුනී කිරීම් සඳහා රාජ්‍ය දැව සංස්ථාවට මුදා හැර ඇති අතර, පූර්ව වාණිජ තුනීකිරීම් සඳහා හෙක්ටයාර් 538 ක් මුදාහරිනු ලැබ ඇත. වගා මිණුම් යටතේ හෙක්ටයාර් 2340 ක වගාවන් ක්ෂේත්‍රයේදී මනිනු ලැබ ඇති අතර, හෙක්ටයාර් 1529 සඳහා මිනුම් පැවරුම් කටයුතු නිමකරනු ලැබින. හෙක්ටයාර් 1392 ක් සම්බන්ධයෙන් කනු සඳහා ගස් කැපීමේ ලේඛනය නිම වී ඇත. පටි කැපීමේ කටයුතු සඳහා හෙක්ටයාර් 17 ක් ලකුණු කොට රාජ්‍ය වැවිලි සංස්ථාවට මුදාහරිනු ලැබ ඇත. හෙක්ටයාර් 242ක වැල් කැපීම ද නිමවී ඇත.

වර්ෂ 1999 සඳහා පරණ වගාවට අයත් හෙක්ටයාර් 2000ක් මැනීමට සැලසුම් කරනු ලැබ ඇත. එසේම, හෙක්ටයාර් 1500ක වන විද්‍යාත්මක ප්‍රතිකර්ම ද මේරූ වගාවේ හෙක්ටයාර් 400ක ප්‍රති ජනන කැපුම් සිදුකිරීමට ද සැලසුම් කරනු ලැබ ඇත. තවද ස්වභාවික වනාන්තර 4ක් සඳහා කළමනාකරණ සැලසුම් සැකසීමට ද සැලසුම්කර ඇත. ප්‍රතිශෝධිත වන වගා මහ සැලැස්මට අනුකූල වෙමින්, හෙක්ටයාර් 400ක් සඳහා වන සංවර්ධනය හා කලමනාකරණයෙහිලා රාජ්‍ය නොවන අංශයේ ආධාර ලබාගැනීමට ද අපේක්ෂාකෙරේ.

## පාරිසරික කළමනාකරණය.

දෙපාර්තමේන්තුව විසින් මේ වසරේදී සිදුකරන ලද පාරිසරික කලමනාකරණ කටයුතු සිංහරාජ හා නකලස් සංරක්ෂණ ප්‍රදේශවලට යොමුවූ අතර, මෙකී කටයුතු සඳහා මූල්‍යාධාර නොරාඩ් ආයතනයෙන් ලබා ගන්නා ලදි. උණ ගස් පරයේෂණ බිම් කොටස් නඩත්තු කිරීම සහ හෙක්ටයාර් 20 ක පයිනස් වගාව පලල් පත්‍ර විශේෂ වගාවන්ට පරිවර්තනය කිරීම සිංහරාජයෙහි ආරම්භ කරන ලදි. නකල්ස් හි සීමාවන් නැවත මායිම් ලකුණු කිරීමේ වැඩ 97% ක් නිමවී ඇත. මෙකී වනාන්තර දෙකෙහි ආරක්ෂක කලාප කළමනාකරණය යටතේ සංරක්ෂණ කටයුතුවල නිරත වන ප්‍රජා මූලික ආයතන වලට ඉන්ධන පිරිමැසුම් ලිප්, ගවමඩු තැනීමේ උපකරණ සහ සමාජ උත්සව සඳහා ජංගම මඩු බෙදාහරිනු ලැබිණ. ආරක්ෂක කලාපයේ ප්‍රසිද්ධ පාරවල් වල මෙන්ම සංරක්ෂිත වන ප්‍රදේශ වල ප්‍රවේශ මාර්ග ශ්‍රමදාන ව්‍යාපාර මගින් නඩත්තු කරණ ලදි. ස්වභාවික වනාන්තර සංරක්ෂණය කිරීමේ අගය සම්බන්ධයෙන් මාතලේ සහ මහනුවර දිස්ත්‍රික්ක වල පාසල් සිසුන් හා ගුරුවරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටන් ක්‍රියාත්මක කරන ලදි.


1999 වර්ෂය සඳහා සැලසුම් කරන ලද කටයුතු නම් උපරිම වශයෙන් රක්ෂිත ප්‍රදේශයෙහි හෙක්ටයාර් 8000 ක් මැන මායිම් ලකුණු කිරීමත් මෙකී ප්‍රදේශ වල සංරක්ෂණ කළමනාකරණ සැලසුම් තුනක් ක්‍රියාත්මක කිරීමත්ය.

## වන වගා ව්‍යාප්තිය හා අධ්‍යාපනය.

වන වගා ව්‍යාප්තියේ සහ අධ්‍යාපනයේ පරමාර්ථය වනුයේ වනසංරක්ෂණය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සහ ඒ පිළිබඳ දැනුම බෙදාහැරීමත් ය. වර්ෂ 1998 දී වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රසිද්ධ දේශන 661 ක් ද සම්මන්ත්‍රන 17 ද, වැඩ මුළු 49 ක් ද, ප්‍රදර්ශන 24 ක් ද, වීඩියෝ දර්ශන 215ක් ද පවත්වනු ලැබ ඇත.

1999 සඳහාද ව්‍යාප්ති සහ අධ්‍යාපනය යටතේ මේ කටයුතු එම ප්‍රමාණයෙන්ම සිදුකරගෙන යාමට සැලසුම් කොට ඇත.

ශ්‍රී ලංකාවේ වන වැස්ම



# රාජ්‍ය දැව සංස්ථාව

දැව ලබා ගැනීම, පරිවර්තනය සහ වාණිජ කරණය යන මේවා 1968 වර්ෂය දක්වා පැවතුනේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ය. මිනිස් බලය, යන්ත්‍රෝපකරණ සහ අනෙකුත් සම්පත්වල නිෂ්පාදිතතාව වැඩිකරගැනීමේ අරමුණ සහ ස්වාධීන කළමනාකරණය තුළින් නිෂ්පාදනය සහ ඵලදායිතාව වැඩිකර ගැනීමේ අරමුනත් ඇතිව පනතින් දී ඇති බලතල, වෙනත් රජයේ චක්‍රලේඛ, කාර්ය පටිපාටිය සහ මාර්ගෝපදේශ යන මේවායින් සලසන ලද බලතල ද සහිතව සම්පූර්ණයෙන් ම රජයේ සංස්ථාවක් වශයෙන් ස්වාධීන ලෙස කටයුතු බාරගැනීම පිණිස රාජ්‍ය දැව සංස්ථාව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1968 දී වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව තුළින් බිහිවිය.

රජය සතු වනාන්තරවලින් හා වැව්ලිවලින් දැව ලබාගැනීමත් විකිනීමත් පිළිබඳ ඒකාධිකාරය රාජ්‍ය දැව සංස්ථාව විසින් උසුලනු ලැබේ. අදාල කලාප ඇතුළත සියළු මෙහෙයුම් කටයුතු පිළිබඳ වගකීම උසුලන කළාපීය කළමනාකාරවරයෙකු විසින් පාලනය කරනු ලබන කළාපීය කාර්යාල දොලහකින් සමස්ථ කාර්ය ජාලය සමන්විත වේ. කළාප දොලහ තුළ කැලේ වැඩකරන වාහන 60 ක් සහ වෙළෙඳ ඩිපෝ 55 ක් ඇති අතර, සංස්ථාවේ නිෂ්පාදන, අළෙවි, පරිපාලන, සේවක සහ වෙනත් අංශයන් හි ප්‍රධාන වශයෙන් කළමනාකරණ, ඉංජිනේරුකටයුතු, මෙහෙයුම් හා ලිපි කාර කටයුතු යනාදී විවිධ ක්ෂේත්‍ර වලට අයත් 2000 කට අධික සේවක පිරිසක් ඒවායේ සේවය කරති.

## 1998 වසරේ කාර්ය සාධනය

### (අ) නිෂ්පාදනය

| | 98.08.31 දක්වා ඉලක්කය | 98.08.31 ලැබූ ප්‍රගතිය | ප්‍රතිශතය |
|---|---|---|---|
| කඳන් | 47,332 | 70,268 | 148% |
| ඉරූ දව දේශීය | 7,311 | 4,421 | 60% |

( වැලිඔය ප්‍රදේශයේ පැවති අයහපත් තත්ත්වය නිසා තලාව හා පදවිය ඉරුම් මෝල් වලට සපයන ලද කඳන් අඩුවු බව පෙනේ. පසුගිය මාසයේ සිට ඉරූ දැව නිෂ්පාදනය වැඩි කිරීම සඳහා දිරි ගැන්වීමේ යෝජනා ක්‍රමයක් හඳුන්වා දී ඇත. )

| | | | |
|---|---|---|---|
| සම්ප්‍රේෂණ පොලු (ගණන) | 32,401 | 29,782 | 92% |



| | | | |
|---|---|---|---|
| සිල්බර (ගණන) | 48,637 | 64,108 | 132% |
| වට පොලු (ගණන) | 59,953 | 2,75,178 | 459% |
| වැට කණු (ගණන) | 69.494 | 1,82,425 | 263% |
| දර (එම් 3) | 85,553 | 1,23,323 | 144% |

### (ආ)අළෙවිය ( රුපියල් මිලියන )

| | අය වැය ගත ඉලක්කය | ලැබූ ප්‍රගතිය | ප්‍රතිශතය |
|---|---|---|---|
| 1. කඳන් | 225.7 | 256.8 | 114% |
| 2. ඉරූ දැව | 153,6 | 76.7 | 50% |
| 3. සම්ප්‍රේෂණ පොලු | 117.7 | 75.4 | 64% |
| 4. පනෙල් | 10.8 | 2.6 | 24% |

( නිෂ්පාදනය වැඩිකිරීම සඳහා දිරිගැන්වීමේ වැඩ පිළිවෙලක් හඳුන්වා දී ඇති අතර, පනෙල් නිෂ්පාදනය සඳහා ජංගම ඉරුම් යන්ත්‍ර උපයෝගී කර ගන්නාලෙසට බන්ඩාරවෙල සහ නුවරඑළිය ප්‍රාදේශීය කළමනාකාරවරුන්ට උපදෙස් දී ඇත. )

| | | | |
|---|---|---|---|
| 5. සිල්බර | 100.1 | 144.5 | 144% |
| 6. දර | 18.4 | 20.0 | 109% |
| 7. ලීබඩු | 35.9 | 19.1 | 53% |
| 8. වෙනත් | 13.2 | 15.8 | 120% |
| | 674.7 | 610.9 | |

( ලී බඩු නිෂ්පාදනය වැඩි කිරීමට අගෝස්තු 1 වැනි දින සිට දිරිගැන්වීමේ යෝජනා ක්‍රමයක් හඳුන්වා දී ඇත. )

### (ඇ) ලාභදායිතාව - (කළාප අනුව) (රු. 000)

| කළාපය | අයවැය ගත ඉලක්කය | ලැබූ ප්‍රගතිය | ප්‍රතිශතය |
|---|---|---|---|
| අම්පාර | 2,897.8 | 2,602.9 | 90% |
| අනුරාධපුර | 3,301.9 | 1,547.5 | 47% |

( පෞද්ගලික දැව වැඩියෙන් මිළයට ගෙන ඉරූ දැව නිෂ්පාදනය වැඩි කිරීමට ප්‍රාදේශීය කළමනාකරුවන්ට උපදෙස් දී ඇත. )

| | | | |
|---|---|---|---|
| බදුල්ල | 14,047.0 | 50,321.6 | 358% |
| කොළඹ | 957.9 | 3,993.8 | 417% |
| මහනුවර | 7,959.0 | 5,880.1 | 417% |

| | | | |
|---|---|---|---|
| කුරුණෑගල | 6,668.9 | 13,634.1 | 74% |
| මාතර | 12,717.6 | 13,253.9 | 104% |
| මොනරාගල | 6,445.9 | 18,882.1 | 292% |
| නුවරඑළිය | 12,965.4 | 61,171.8 | 475% |
| පොලොන්නරුව | 5,239.2 | 9,116.3 | 189% |
| රත්නපුර | 4,973.8 | 10,448.5 | 210% |
| කල්දෙමුල්ල සංකීර්ණය | 14,985.4 | 22,248.5 | 148% |
| ඔරුගොඩවත්ත මධ්‍යම යන්ත්‍රාගාරය. | 9,428.4 | 4,361.5 | 46% |

( පුද්ගලික දැව වැඩියෙන් මිළදී ගෙන ඔරුගොඩවත්ත මධ්‍යම යන්ත්‍රාගාරයට එවන ලෙස මහනුවර හා කුරුණෑගල ප්‍රාදේශීය කළමනාකරුවන්ට උපදෙස් දී ඇත. තවද දැන්වීම් මගින් පෞද්ගලික දැව පදම් කිරීම පිළිබඳ තොරතුරු ප්‍රවර්ධනය කරන ලෙසට ඔරුගොඩවත්ත යන්ත්‍රාගාරයේ කළමනාකරුට උපදෙස් දී ඇත. )

| | | | |
|---|---|---|---|
| යාපනය | 261.0 | 230.8 | 88% |
| ප්‍රදර්ශනාගාරය | 1,418.6 | 2,709.8 | 191% |
| ප්‍රධාන කාර්යාලය | 31,810.3 | 5,744.8 | 182% |

## (ඈ) වෙනත් තොරතුරු

98.08.31 දිනට මුදල් තත්ත්වය දශලක්ෂ 31.2 වු අතර, 98.08.31 දිනට අයවැය ගත මුදල් ගලනය දශලක්ෂ 16.5 කි.

98.08.31 දිනට තොග තත්ත්වය රුපියල් දශලක්ෂ 81.2 වු අතර කළින් මාසය හා සසදන විට මෙය දශලක්ෂ 0.3 ක වැඩි වීමකි.

## (ඉ) ආයෝජන

| | 1998.08.31 දක්වා ලැබු ප්‍රගතිය ( රුපියල් දශලක්ෂ) |
|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | 231.9 |
| රාජ්‍ය උකස් බැංකු ණය යෝජනා ක්‍රමය | 21.6 |
| ලංකා මැෂින් ලීසර්ස් | 3.5 |
| රිඩෙකෝ | 0.5 |
| ගොවි බැංකුව | 20.0 |
| එකතුව | 277.5 |

# ක්‍රියාත්මක සැලැස්ම - 1999

## 1. මානව සම්පත් දියුණු කිරීම තුළින් නිෂ්පාදිතතාව වර්ධනය

(i) 1999 පටන් කළමනාකරණ ප්‍රමිති දියුණු කිරීමේත් සේවකයන්ගේ උනන්දුව වැඩි කිරීමේත් අරමුණ ඇතිව සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීමට සංස්ථාව දැනටමත් ක්‍රියාරම්භකොට ඇත. එක් එක් අංශ සඳහා 1999 පෙබරවාරි මස සිට තත්ත්ව කව ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. ගුණාත්මක භාවය සහ නිෂ්පාදනීය පරිසරය බිහිකිරීම සඳහා ජපන් ක්‍රමයක් වන 5 "එස්" ක්‍රමය යොදා ගනිමින් එක් එක් කළාපයේ ආදර්ශ ඩිපෝවක් බිහි කිරීමට අදහස් කෙරේ.

## (ii) ප්‍රති ව්‍යුහ ගත කිරීම

1999 සිට ක්‍රියාකාරීත්වය පුළුල් වීමට සරිලන පරිදි සංස්ථාවේ කළමනාකරණ සංවිධානය තුළ වෙනස්කම් සිදු කිරීම පිණිස වන සම්පත් හා පරිසර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේත් මහා භාණ්ඩාගාරයේත් වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේත් නියෝජිතයන්ගෙන් හා වෘත්තිකයන් ගෙන් සැදුම්ලත් කාර්යය බලකායක් දැනටමත් පිහිටුවනු ලැබ ඇත. ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය විසින් කාර්යය අගැයීමක් දැනටමත් සිදු කොට වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර, ආයතනයේ අවසාන ප්‍රතිව්‍යුහ කරණය ක්‍රියාත්මක කිරීමේදී එය ද සැලකිල්ලට ගනු ඇත.

## 2. අංශීය සංවර්ධන.

දැනට පවත්නා ක්‍රමය ප්‍රතිශෝධනය කිරීමෙන් පසුව, භාණ්ඩාගාරයේ උපදෙස් අනුගමනය කරමින්, අළුතෙන් පත්කරනු ලබන ප්‍රධාන අභ්‍යන්තර විගණක යටතේ සංස්ථාවේ දැනට තිබෙන අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ.

තවද ක්‍රම සම්පාදන කළමනාකරුවකු යටතේ ක්‍රම සම්පාදන අංශයක් පිහිටුවීමට ද, අළුතින් පත් කරනු ලබන මූල්‍ය කළමනාකරවරයකු, ගණකාධිකාරීවරයෙකු, පරිඝනක වැඩ සටහන් සම්පාදකයන් හා විශ්ලේෂකයන් ද සහිතව මුදල් අංශය ශක්තිමත් කිරීම ද සිදුකෙරේ.

### 3. පුහුණු කිරීම.

රටේ දැව කර්මාන්තයේ ඉතා වැදගත් හා ඉතා ප්‍රමුඛ ස්ථානයක් ඉරුම් යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට හිමිවන අතර, ඉරුම සහ ඉරුම් වෙනස් කිරීමේ ක්‍රම පිළිබඳව අභ්‍යන්තර හා බාහිර අයදුම් කරුවන් සඳහා රත්මලානේ හා තිඹොල්කැටියේ ලී ඉරීම පිළිබඳ සේවාස්ථ ස්ථිර පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා කටයුතු ආරම්භ කොට ඇත.

### 4. සුභ සාධන ක්‍රියාමාර්ග.

වෛද්‍ය ප්‍රතිලාභ වැඩි කිරීමට අදහස් කර ඇති අතර, ඇස් කන්නාඩි දීම සඳහා අනුමතිය දැනටමත් ලබා ගෙන ඇත.

මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ වාර ප්‍රවේශ පත්‍ර ගාස්තුවෙන් අඩක් ගෙවීමට දැනට සලසා ඇති අර්ධ ප්‍රවාහන සහනය පෞද්ගලික බස්වල ගමන් කිරීම සඳහා ද දීර්ඝ කෙරෙනු ඇත.

ආහාර හා කෘෂිකර්ම සංවිධානය වැනි ආයතන මගින් විවිධ මාර්ග සහ ප්‍රදානයන් තුළින් ප්‍රදායක රටවලින් සහ සංවිධාන වලින් දෙනු ලබන අවස්ථාවන් දැව සංස්ථාවේ සේවකයන්ට ද ලබා දීම.

### 5. මෙහෙයුම් සහ ආදායම් වැඩි කිරීමේ ක්‍රියා මාර්ග

#### (i) දැව සැපයීම

පෞද්ගලික අයිති කරුවන්ගෙන් සහ වතු වලින් වැඩි පුර දැව ලබා ගැනීමටත් ඉලක්ක ගත නියමිත කාල අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් මුදා හරිනු ලබන ප්‍රදේශ වල ගස් කැපීම සම්පූර්ණ කිරීමටත් ක්‍රියාමාර්ග සකස් කිරීම.

ගරු වන සම්පත් හා පරිසර ඇමති තුමා විසින් යෝජිත පරිදි 1999 සිට ක්‍රියාත්මක කෙරෙන කළින් ගස් මිළදී ගැනීමේ යෝජිත ක්‍රම අනුව මහනුවර දිස්ත්‍රික්කයේ නියමු ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අදහස් කොට ඇති අතර රාජ්‍ය දැව සංස්ථාව විසින් ඒ සඳහා රුපියල් දශලක්ෂ 10 දක්වා මුදල් වෙන් කරනු ඇත. නියමු ව්‍යාපෘතිය සාර්ථක වූ විට මෙම ක්‍රමය අනෙක් දිස්ත්‍රික්ක වලටද ව්‍යාප්ත කෙරේ. මේ ක්‍රමයෙන් සංස්ථාවේ මිලදී ගැනිමේ ශක්තිය වැඩිවෙතැයි අපේක්ෂා කරන අතර වැඩියෙන් ගස් වවා ඒවා මේරීමට පෙර අවුරුදු පහක කාලයකින් අදායමක් ලබා ගැනීමට ද ගස් වවන්නන් දිරිමත් කෙරෙනු ඇත.

#### (ii) ලී ඉරීම.

කැප්පෙටිපොල, බොරලන්ද හා රත්මලාන යන ස්ථානවල පිහිටුවීම සඳහා ලී ඉරීමේ යන්ත්‍ර තුනක් සංස්ථාව මිලට ගනු ඇත. වැලිකඩ හා බෝගම්බර බන්ධනාගාර ඉරුම් මෝල් ඉරූ දැව නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට ද කටයුතු ආරම්භ කොට ඇත. වාර්ෂික ව රුපියල් මිලියන 110 ක වටිනා කමින් යුත් ඝන මීටර් 6000 වන වර්තමාන ඉරූ දැව නිෂ්පාදනය 40% කින් වැඩි කිරීමට බලාපොරොත්තු වේ.

ඉරුම් කරුවන් ගේ, යන්ත්‍ර ක්‍රියාකරුවන් ගේ සහ ඉරුම් කැපුම් දමන්නන් ගේ නිෂ්පාදිතතාව පුහුණුව තුළින් වැඩි කිරීමට බලාපොරොත්තුවේ.

අපතේ යාම අවම කිරීම පිණිස දැනටමත් හඳුනා ගෙන ඇති නව ක්‍රම ක්‍රියාත්මක කිරීමටද වැඩි පුර ගබඩාකර තබා ගැනීමත් කඩිනම් පිරිවැටුමත් අවම කිරීම සඳහා ශ්‍රේණි ගත කිරීමේ ක්‍රම සහ තොග පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීමට ද නිර්දේශිත ය. ආමානයෙන් යුත් කියත් පාවිච්චි කිරීමෙන් දැව පරිවර්තනයේ දී සිදුවන පාඩුව අවම කර ගැනීමට අපේක්ෂිතය.

සේවා දායකයාගේ අවශ්‍යතාවන් ට අනුව නිශ්පාදනය කිරීමත් ඉක්මනින් විකිනෙන ද්‍රව්‍ය, නිමි භාන්ඩ සහ අර්ධ නිමි භාන්ඩ නිශ්පාදනයටත් අමුද්‍රව්‍ය වශයෙන් දැව විකිනීමටත් අපේක්ෂා කෙරේ.

#### (iii) අලෙවිය සහ විකිණීම

තිබෙන ඉරුම් මෝල් 10 ද 1999 මිලට ගැනීමට අදහස් කරණ ඉරුම් යන්ත්‍ර තුනද යොදා ගනිමින් කඳන් දැව වෙනුවට ඉරූ දැව වැඩියෙන් නිශ්පාදනය කර විකිනීමට අපේක්ෂා කෙරේ.

එසේම වැඩි පිරිවැටුමක් අපේක්ෂා කරමින් මිනිස් බලය යොදාගෙන එමගින් වැඩියෙන් රැකියා අවස්ථා උදාකරමින් ගණුදෙනු කරුවන්ගේ පිරිවිතර වලට සහ ප්‍රමිති වලට අනුව දොරවල් හා ජනෙල් රාමු, ජනෙල් පටි, සීලිං ලෑලි සහ බිත්ති පනෙල් වැනි නිමි භාන්ඩ සෑදීමට පියවර ගැනේ.

## (iv) පීඩන ප්‍රතිකර්ම පර්යේෂණ හා සංවර්ධනය.

සම්මත සවි ශක්ති ගුණාංග වලට ඇතුළත් නොවන කල් පැවැත්ම අඩු සහ දිලීර බෝවීමට ඉඩ ඇති ඇස්ටෝනියා, පයිනස්, රබර් වැනි දැව පදම් කිරීම නිශ්චනය, සම පීඩන ප්‍රතිකර්ම වැනි සම්මත ප්‍රතිකර්ම ක්‍රම භාවිතා කරමින් රසායනික ප්‍රතිකර්ම වලට භාජනය කොට ඒවායේ තත්ත්වය ඉහළ නැංවිය හැකිය. පර්යේෂණ කළමනාකරවරයා යටතේ තිබෙන පර්යේෂණ අංශය සංවර්ධනය කිරීමටත් ශ්‍රී ජයවර්ධන පුර විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය සහ ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය වැනි පර්යේෂණ පහසුකම් සහිත ආයතන සමග සම්බන්ධ වී මෙකී අප්‍රකට දැව හඳුන්වාදීමට අපේක්ෂා කරයි. මෙබඳු දැව වර්ග භාවිතා කිරීමෙන් ඉදිකිරීම් කටයුතු වලදී අතිරේක අගයක් යොදාගත හැකි වන අතර, උසස් තත්ත්වයේ දැව ලෙසට ද භාවිතාකළ හැකි වනු ඇත.

## (v) ලී බඩු නිෂ්පාදනය

1999 සිට දැනට විශාල පරිමාණයෙන් සිදුකරනු ලබන ගෘහභාන්ඩ, උළුවහු සහ ජනෙල් රාමු, කැටයම් දැමූ දොරවල්, සීලිං ලෑලි හා බිත්ති පනෙල් ද වැඩියෙන් නිෂ්පාදනය කෙරේ.

ඉරුම් කුඩු, ලී පතුරු හා ලී කැබලි වැනි අපතේ යන දැව ද්‍රව්‍ය වලින් බීරළු, බිත්ති ඔරලෝසු වැනි විසිතුරු භාන්ඩ, කුස්සි උපකරණ, සැරසිලි භාණ්ඩ වැනි අලෙවි කළ හැකි දේ නිපදවීම.

බාල ලී බඩු නිෂ්පාදනයේ දී හා අලෙවියේදී ප්‍රධාන අඩුපාඩුවක් වශයෙන් අධීක්ෂණය සහ තත්ත්ව පාලනය නොමැති වීම හඳුනා ගනු ලැබ ඇත. 1999 සිට නිශ්පාදනයේ මුල සිට අග දක්වාම නිශ්පාදන තත්ත්ව පාලනය ඇති කිරීම සඳහා තත්ත්ව පාලන කළමනාකරුවකු යටතේ අම්පාරේ සහ කල්දේමුල්ලේ තත්ත්ව පාලන ඒකක පිහිටුවනු ලැබේ.

## 6. නව ව්‍යාපාර


(i) විදේශ වෙළෙඳපොළ සඳහා පයිනස් ගස් වලින් ලාටු ලබා ගැනීම පිණිස ඔලියෝ රෙක්සින් ව්‍යාපෘතියක් ඇති කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා ගෙන ඇත. මුලදී, මාතර දිස්ත්‍රික්කයෙන් හෙක්ටයාර් 1000 ක බිම් පෙදෙසක් මේ සඳහා යොදා ගැනේ. රේසින් ලාටු ලාබා ගැනීමේ කටයුතු වෙනම කළාප කළමනාකරුවකු වසින් සිදුකරනු ලබනවා ඇති අතර, ලාටු වාස්සන්නන් හා එකතු කරනන් සඳහා ද ඒවා ගබඩා කිරීම හා ප්‍රවාහනය කිරීම සඳහා ද අපනයන කිරීමේ කටයුතු සඳහාද රැකියා අවස්ථා උදාවෙනු ඇත.

(ii) පෞද්ගලික අංශයේ සංවිධාන රැසක් විසින් කරණ ලද ඉල්ලීම පරිදි වේවැල් ආනයනය කිරීමට තීරණය කර ඇත. අම්පාර සහ කල්දෙමුල්ල කම්හල්වල වේවැල් භාන්ඩ නිශ්පාදනය ගැන ද සොයා බැලේ.

(iii) රත්නපුර සහ මහනුවර අළුතෙන් ලී බඩු ප්‍රදර්ශනාගාර දෙකක් පිහිටුවනු ලැබේ.

(iv) නැවත වන වගා කිරීමේ ඒකකයක් ප්‍රති වන රෝපණ කළමනාකරුවකු යටතේ පිහිටුවීමට ද නැවත වන වගා ආරම්භ කිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගැනීමට ද අදහස් කෙරේ.

දැනට පවතින වගාවන්ගෙන් සැපයෙන දැව (වර්තමාන ප්‍රවනතාව අනුව)



# පරිසරය

මෙරට ජනතාවට යහපත් ජීවන තත්ත්වයක් ලබාදීම පිණිස පරිසරය ආරක්ෂා කිරීමත් සංරක්ෂණය කිරීම හා වැඩි දියුණු කිරීමත් සඳහා 1998 වසරේදී ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කිරීමට විධි විධාන යොදන ලදි.


සියළුම සංවර්ධන ප්‍රතිපත්ති තුළට සහ වැඩ සටහන් තුළට පාරිසරික ප්‍රතිපත්ති අනුයෝජනය කිරීම සඳහා තවදුරටත් ක්‍රියා කරනු ලැබේ. මේ සම්බන්ධයෙන්, ආයතනාන්තර සම්බන්ධීකරණ කමිටු ගොඩනැගීමට විධි විධාන යෙදේ.

පාරිසරික ප්‍රතිපත්තියක් සකස් කොට ක්‍රියාත්මක කිරීම අතිශයින් වැදගත්වේ. මෙහිලා මේ අමාත්‍යාංශය විසින් කෙටුම්පත් කරන ලද නව නීති පාර්ලිමේන්තුවෙන් සම්මත වී ක්‍රියාත්මක කැරෙන බවට වග බලාගැනීම සඳහා පසු විපරම් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

පාරිසරික බලපෑම් තක්සේරුව සහ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර යෝජනා ක්‍රමය පිළිබඳව ජාතික පරිසර පනත යටතේ සකස් කරන ලද නියෝග සහ රෙගුලාසි, පාරිසරික වශයෙන් හිතකර සහ ප්‍රවර්තනීය වර්ධනයක් ඇති කර ගනු පිණිස ක්‍රියාත්මක කිරීමට පියවර ගැනේ.

මීට අමතරව, ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීමත්, ඝන සහ උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණයත්, පාරිසරික අධ්‍යාපනය සහ දැනුවත් බව ඇති කිරීමත්, ජාතික පරිසර පනතේ බලතල සුදුසු පරිදි පළාත් සභාවලට, ප්‍රාදේශීය ලේකම්වරුන්ට සහ අදාළ අමාත්‍යාංශවලට පවරා දීමත්, වඩා හොඳ පාරිසරික කළමනාකරණයක් සඳහා අදාල සංවිධාන තුළ ආයතනමය ශක්තිකරණය සහ ධාරිතා වර්ධනයත්, ශ්‍රී ලංකාව විසින් පිළිගන්නා ලද ජාත්‍යන්තර ප්‍රඥප්තිවල බැඳීම් ක්‍රියාත්මක කිරීමත්, පරිසරය සඳහා ප්‍රදානය කෙරෙන විදේශ ආධාර උපයෝගී කර ගැනීම සහ මෙහෙයවීමත්, මේ වසරේ ක්‍රියාත්මක කෙරෙන අනෙකුත් වැඩ සටහන් වේ.

# ජාතික පාරිසරික ක්‍රියාත්මක සැලැස්ම



වන සම්පත් හා පරිසර අමාත්‍යාංශයේ, මෙහෙවර ප්‍රකාශය අනුව, පරිසර සංරක්ෂණයෙහි ලා නායකත්වයක් දීමට බැඳී ඇති බැවින්, ඒ අනුව 1998 වර්ෂයේ වැඩ කටයුතු නැවත සංවිධානය කර ගැනීමට සිදු විය. මෙහි ලා නායකත්වය යන්නෙන් අදහස් කරන්නේ පරිසර සංරක්ෂණ සංකල්ප සම්පාදනයේදී දක්වන නායකත්වයයි. ඒ සමගම එම සංකල්ප විවිධ වැඩ සටහන්වලට අන්තර්ග්‍රහණය විය යුතුය. මෙම අරමුණ පෙරදැරි කර ගෙන පරිසර වැඩ සටහනට සම්බන්ධ සියලුම පාර්ශව සහභාගි කරවාගෙන ජාතික පාරිසරික ක්‍රියාත්මක සැලැස්ම යාවත්කාලීන කරන ලදි. මෙම කටයුත්ත සම්පූර්ණ කරන ලද්දේ විවිධ අමාත්‍යාංශවල ලේකම්වරුන්ගේ සහභාගිත්වයෙන් සහ අදාල ආයතන සම්බන්ධ කර ගෙනය. ප්‍රමුඛත්වයක් යටතේ ක්‍රියාත්මක වනු වස් පහත සඳහන් පරිසර ක්ෂේත්‍ර මෙම සැලැස්මෙහි හඳුනා ගන්නා ලදි.

(අ) ඉඩම්

(ආ) ජලය

(ඇ) ජෛව විවිධත්වය

(ඈ) වෙරළ සම්පත්

(ඉ) කර්මාන්ත

(ඊ). නාගරික පරිසරය

(උ) බල ශක්ති හා ඛණිජ සම්පත්

(ඌ) පරිසර සෞඛ්‍යය

ඒ ඒ ක්ෂේත්‍රවලට අදාල නිර්දේශ කිහිපයක් ම මෙම සැලසුම මගින් ඉදිරිපත් කරන ලදි. එම ලේඛණය සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත යථා කාලයේදී ඉදිරිපත් කරනු ඇත. ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලීන ආර්ථික සංවර්ධනය හා කෘෂිකර්ම සංරක්ෂණය සම්බන්ධයෙන් මෙම සැලැස්මේ අවධානය යොමු වී ඇත. මේ මගින් ඉදිරි අනාගතයේ දී ඇරඹෙන ආර්ථික සංවර්ධන සහ පරිසර සංරක්ෂණ කටයුතු සඳහා මාර්ගෝපදේශකත්වයක් ලැබේ යයි අපේක්ෂා කෙරේ. ප්‍රථම පාරිසරික ක්‍රියාකාරී ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපත්ති අධ්‍යයනයන් කිහිපයක්ම සංවිධානය කරන ලද අතර, එම අධ්‍යයන 18 ක් සම්පූර්ණ කර ඇත. ජාතික මට්ටමේ සහ ක්ෂේත්‍ර මට්ටමේ ප්‍රතිපත්ති, පරිසර දූෂණය කෙරෙහි බලපාන අයුරු මෙම අධ්‍යයනවලින් හෙළි වන අතර, එම අධ්‍යයනයන් භාර ගෙන ක්‍රියා කරන ලද්දේ විශ්ව විද්‍යාල ආචාර්යවරුන් සහ වෙනත් බුද්ධිමතුන් විසින්ය. අර්තාපල් සඳහා පනවන ලද ආනයන තීරු බදු සහ කඳු රට පස සෝදා යාම අතර ඇති සූක්ෂම සම්බන්ධතාවය එක් හැදෑරීමකින් ඉස්මතු වී ඇත.

ජාතික පාරිසරික ක්‍රියාත්මක සැලැස්ම සහ ප්‍රතිපත්ති අධ්‍යයනවලින් ඉස්මතු වන නිර්දේශ, රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සැදුම් ලත් කමිටු ඉදිරියේ තැබීමට රජය අදහස් කර ඇත. මෙම පාරිසරික ප්‍රතිපත්ති හා කළමනාකරණ කමිටු ඉහත කී ඉඩම්, ජලය, ජෛව විවිධත්වය ආදී ක්ෂේත්‍ර ආශ්‍රිතවම පිහිටුවා ඇත. අමාත්‍යාංශ ලේකම්වරුන් සමග සාකච්ඡාවෙන් පසු පිහිටුවන ලද මෙම කමිටු මගින් ඒ ඒ විෂයය ගැඹුරින් හදාරනු ලබන අතර, ඒවා තවදුරටත් පරිසර සංවර්ධන කමිටු හා ආර්ථික සංවර්ධනය සම්බන්ධීකරණය කිරීමේ කමිටුවලට ඉදිරිපත කිරීමට අදහස් කර ඇත. මෙම කමිටුවලින් විසඳීමට නොහැකි ප්‍රශ්න අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

පරිසර සංරක්ෂණය හා ආර්ථික සංවර්ධනයට අදාල පර්යේෂණ හා හැදෑරීම් බොහෝ සංඛ්‍යාවක් ඇති නමුත්, මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන ඇති බවක් නොපෙනේ. ඉහත කී ආයතනිකමය සංවිධානය මගින් මෙම අඩුව පිරිමැසෙනු ඇත. මෙම කමිටුවලට අවශ්‍ය විශේෂඥ පසුබිම් වාර්තා ආදිය අමාත්‍යාංශය විසින් සපයනු ඇත. මේ මගින් පරිසර සංරක්ෂණ හා ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රය සඳහා ගැඹුරින් ප්‍රවේශවීමට අවකාශ ලැබෙනු ඇත.

පරිසර සංරක්ෂණ හා ආර්ථික සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීමේදී අමාත්‍යාංශය විසින් වැදගත් මෙහෙයක් ඉටු කර ඇත. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරුන් සම්බන්ධ කර ගෙන වැඩ මුළු කිහිපයක් පවත්වා ඇත. එසේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමග පරිසර සංරක්ෂණ සංකල්ප බෙදා හදා ගැනීමටත්, එතුමන්ලාගේ අත්දැකීම්වලින් ප්‍රයෝජන ගැනීම පිණිසත්, අමාත්‍යාංශය විසින් වැඩ මුළුවක් පවත්වන ලදි.

## ක්‍රියාත්මක සැලැස්ම - 1999

ඉදිරි වර්ෂයේ මීට අදාලව වැඩ සටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇත. ඒවා අතරින් ඉතා වැදගත් වන්නේ මුලින් සඳහන් කළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත කමිටු පිහිටුවීමයි.


ප්‍රමුඛත්ව වැඩ සටහන් ආශ්‍රිතව විශේෂඥ හැදෑරීම් කිහිපයක් ආරම්භ කිරීමට ද අමාත්‍යාංශය අදහස් කර ඇත.

අන්තර්ජාතික සම්බන්ධතා හා ප්‍රවණතා ශ්‍රී ලංකාවෙහි ස්වාභාවික සම්පත් කෙරෙහි බලපාන අයුරු හැදෑරීමට ද විශේෂඥ අධ්‍යයන ආරම්භ කරනු ඇත.

ජාත්‍යන්තර සම්මුති, සන්ධාන හා ගිවිසුම් මගින් ශ්‍රී ලංකාවට පැවරෙන වගකීම් පිළිබඳව ගත යුතු පියවර ගැන ද අමාත්‍යාංශයේ අවධානය යොමු වනු ඇත.

වර්තමානයෙහි පරිසර සංරක්ෂණයට අදාල කරුණු සම්බන්ධයෙන් ද, අනාගතයට බලපාන කරුණු සම්බන්ධයෙන් ද අඛණ්ඩ අධ්‍යයන හා හැදෑරීම් අරඹනු ලබන අතර, එහි ප්‍රතිඵල ඔස්සේ ධරණීය සංවර්ධන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය විසින් රජයට අදාල උපදෙස් ලබා දෙනු ඇත.

# පරිසර දූෂණ පාලනය



පරිසර දූෂණ පාලනය හා කළමනාකරණය, රාජ්‍යආයතන, පුද්ගලික අංශය හා පුරවැසි කණ්ඩායම් ඇතුළු සියළුම අංශවල සාමූහික වගකීමක් හා අවශ්‍යයෙන්ම කළ යුත්තකි. වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය විසින් පිහිටුවා ඇති සම්බන්ධීකරණ කමිට්ටුවක් විසින් පරිසර දූෂණ කළමණාකරණ කාර්යයන් වල ප්‍රගතිය සමාලෝචනය කර, නිරෝධයන් හඳුනාගෙන දූෂණයට අදාල විශේෂිත ගැටළු මධ්‍යම පරිසර අධිකාරිය හා අනෙකුත් පාර්ශව කරුවන්ට සලකා බැලීමට ඉදිරිපත් කර ඇත.

මෙම රැස්වීමේදී සලකා බලන ලද විශේෂිත ප්‍රශ්න පහත දැක්වේ.

- පාරිසරික කාර්‍යයන් විමධ්‍යගත කිරීම
- පිහිටීම, ශුද්ධ කිරීම් ආශ්‍රිත ගැටළු
- පරිසර සංවර්ධන සහායකයින් පුහුණු කිරීම
- පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ආශ්‍රිත ගැටළු
- කර්මාන්තමය හා නාගරික දූෂණය ආශ්‍රිත විශේෂිත දූෂණ ගැටළු

ඊට අමතරව දිගන ප්‍රදේශයේ කළුගල් කැඩීම නිසා සිදුවන දූෂණයන් පිළිබඳ පරීක්ෂණයක් මධ්‍යම පරිසර අධිකාරිය හා ආශ්‍රිත සංවිධාන ද සමග පවත්වා කළුගල් කැඩීමෙන් සිදුවන දූෂණය ලිහිල්කිරීමේ ක්‍රියාමාර්ග ගැන ද සොයාබලන ලදි.

වැඩි කාර්‍යක්ෂමතාවකට යොමුකෙරෙන බැවින් පුද්ගලික අංගයට වගකීම් පැවරීමේ රජයේ පොදු ප්‍රතිපත්තියට අනුකූලවෙමින්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් පුද්ගලික රසායනාගාර වලට බලය පැවරීමේ වැඩසටහනට අනුග්‍රහය දැක්වීමට පාරිසරික රසායනාගාර වලට බලය පැවරීමට අදාල විශේෂිත ප්‍රශ්න සාකච්ඡා කිරීමට ද රැස්වීමක් කැඳවන ලද්දේය.

එක්සත් ජාතීන්ගේ පරිසර වැඩ සටහන, දකුණු ආසියාතික පරිසර වැඩ සටහන හා නොරාඩ් පරිසර වැඩ සටහන යන සංවිධාන තුනේ ඒකාබද්ධ වැඩසටහන යටතේ පාරිසරික ප්‍රමිතීන් හා ආධාර ඇතිකිරීමට විනිවිද පෙනෙන හා සහභාගීත්ව ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා කාර්යයන් සිදුකෙරෙමින් පවතින්නේය.

එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ සහයෝගිත්වයෙන් කාබනික දූෂකයන් පිළිබඳව දැනුවත් බව වර්ධනය කිරීමේ වැඩමුළුවක් රට තුළ පාර්ශව කරුවන් සඳහා සංවිධානය කරණ ලදි.

පරිසරය ආශ්‍රිත ප්‍රශ්ණ සලකා බැලීමට පළාත් පාලන කොමසාරිස්වරුන් මගින් ඒ ඒ බල ප්‍රදේශ තුළ පාරිසරික ඒකක ඇති කිරීමට පළාත් අධිකාරීන් ධෛර්යමත් කරන ලදි. ඒ අනුව බස්නාහිර පළාතේ සියළුම පළාත් පාලන බල ප්‍රදේශවල හා

අනෙකුත් පළාත් වල බොහෝ පළාත් පාලන ප්‍රදේශවල ද මෙම ඒකක පිහිටුවා තිබේ. කෙසේ වෙතත් මෙම ඒකක ක්‍රියාත්මක කිරීම අවශ්‍යවේ.

## ඝන අපද්‍රව්‍ය කලමනාකරණය.

ජාතික ඝණ අපද්‍රව්‍ය කලමනාකරණ ක්‍රමෝපායක කෙටුම් පතක් පිළියෙල කර මධ්‍යම පරිසර අධිකාරියේ හා වෙනත් අදාල අධිකාරීන්ගේද සහයෝගීත්වයෙන් එහි කටයුතු නිම කරන ලදි. ලිහිල්කිරීමේ ක්‍රියාවලියක් ද දක්වමින් ප්ලාස්ටික් භාවිතය හා ඉවත්කිරීමේ පාරිසරික හා සෞඛ්‍ය බලපෑම් ලිහිල් කිරීම පිළිබඳව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ද සකස්කරණ ලද්දේය.

යෝජිත ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා අවසාන අපහරණයට පළමුව හීන කිරීම, යලි භාවිතය හා ප්‍රතිචක්‍රීය කිරීම යොමුකරගත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමෝපායන් ඇතිකිරීමට සහයවීම පිණිස අමාත්‍යාංශය සිය කාර්‍යයන් දිගටම කරගෙන යන ලදි.

ක්‍රියාත්මක කිරීමේ ආයතනය වශයෙන් නරඩ් ආයතනයේද සහය ඇතිව නොරාඩ් මුදල් යෙදවීම යටතේ මහරගම ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් / ජීව වායු නිෂ්පාදන ව්‍යාපෘතියක් ඇතිකිරීම පිණිස ක්‍රියාකරමින් පවතී. මෙම ව්‍යාපෘතිය ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීමට සහය වනු පිනිස ගෘහ මට්ටමින් අපද්‍රව්‍ය මූලයන් අඩුකිරීම හා අපද්‍රව්‍ය වෙන්කිරීම පිණිස නියමු ව්‍යාපෘතියක් ඇතිකිරීමට අමාත්‍යාංශය මහරගම ප්‍රාදේශීය සභාවට පහසුකම් සැලසීය. මෙම නියමු අධ්‍යයනය මහාමේඝවත්ත ප්‍රදේශයේ නිවාස 260 කින් ඇරඹිනි. මෙම උත්සාහයන් වල ප්‍රධාන අරමුණ නම් ප්‍රාදේශීය මට්ටමේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමෝපාය ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති විකල්පයන් හඳුනාගෙන විශ්ලේෂණය කිරීමය.

## ශ්‍රී ලංකාවේ ඝන අපද්‍රව්‍ය උත්පාදනය (මහනගර ආශ්‍රිතව) පිළිබඳ දත්ත බැංකුව.

ශ්‍රී ලංකාවේ ඝන අපද්‍රව්‍ය උත්පාදනය පිළිබඳව කරන ලද දත්ත මූලය වලංගු කිරීමට සමීක්ෂණ පවත්වන ලදි. මෙම කාර්යය සඳහා පළාත් බද වැඩමුළු පැවැත්වින. වලංගු කිරීමේ කාර්යය සම්පූර්ණ කළ පසු දත්ත මූලය ප්‍රකාශයට පත්කිරීමට අමාත්‍යංශය බලාපොරොත්තුවේ.

## උපද්‍රවකාරී අපද්‍රව්‍ය දේශ සීමා හරහා ගෙනයාම පාලනය කිරීමේ බාසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීම හා ඒවායේ අපහරණය.

ශ්‍රී ලංකාව 1992 අගෝස්තු මාසයේ දී බාසල් සම්මුතිය පිළිගන්නා ලදි. ඒ අනුව වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය සම්මුතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව මෙරටේ කේන්ද්‍රීය ස්ථානය වන අතර, මධ්‍යම පරිසර අධිකාරිය මෙම සම්මුතියේ නිසි බලධාරියා වශයෙන් ක්‍රියාකරයි.

බාසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය විසින් ජාතික සම්බන්ධීකරණ කමිටුවක් පිහිටුවා තිබේ. සම්මුතියේ විවිධ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම පිළිබඳව වු ප්‍රතිපත්ති ප්‍රශ්ණ හා එම රැස්වීම් වලදී එළඹි තීරණ ද නොයෙකුත් කාරණා පිළිබඳව ගත යුතු ස්ථාවරයන් ද සම්මුතිය හා සම්බන්ධිත වෙනත් කරුණු ද සාමාන්‍යයෙන් සලකා බලනු ලබන්නේ මෙම රැස්වීමේදීය. මෙම කමිටුවට වාණිජ හා කර්මාන්ත සමුළු සම්මේලනය, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය, රේගු දෙපාර්තමේන්තුව, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, වාණිජ දෙපාර්තමේන්තුව, මුහුදු දූෂණ වැලැක්වීමේ අධිකාරිය හා මධ්‍යම පරිසර අධිකාරිය වැනි නොයෙකුත් ආයතන වල නියෝජිතයින් ඇතුළත් වේ.

1996 දී ගැසට් පත්‍රයේ පල කරන ලද උපද්‍රවකාරී අපද්‍රව්‍ය පිළිබඳව වු රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කළයුතු වීම එම රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට කලක සිට දැනුනු අවශ්‍යතාවක් විය. ක්‍රියාත්මක කිරීමේ ආයතනය වශයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ ද අනෙකුත් අදාල සංවිධාන වලද සහයෝගීත්වයෙන් මාර්ගෝපදේශ පෙළක් පිළියෙල කරන ලදි. නෝර්වීජියානු මූල්‍යමය හා කාර්මික සහය මෙම මාර්ගෝපදේශ පිළියෙල කිරීමට ලබාගෙන ඇත.


උපද්‍රව කාරී අපද්‍රව්‍ය පිළිබඳ රෙගුලාසි ප්‍රබල අන්දමින් ක්‍රියාත්මක කිරීමට හැකි වන්නේ නිසි උපද්‍රවකාරී අපද්‍රව්‍ය අපහරණ පහසුකම් රටේ ඇති විටය. කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශයේ සහයෝගීතාවයෙන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය අපහරණ පහසු කම් කලින් ඒ සඳහා තෝරාගෙන තිබු පිහිටීම් දෙක පාදකව ස්ථාපනය කිරීමට වීඩි විධාන පිළියෙල කරමින් පවතී. ඒ අතරම පාරිසරිකව යහපත් උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමානාකරණයක් රටට ඇති බව සහතික කිරීම පිණිස උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් පිළියෙල වෙමින් පවතී. මෙම සැලැස්ම ලබන වසරේදී සම්පූර්ණ කිරීමට අමාත්‍යාංශය බලාපොරොත්තු වේ.

උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය මූලික වශයෙන් අදාල සියල්ලන්ටම අළුත් අංශයකි. උපද්‍රකාරී අපද්‍රව්‍ය කළමනාකරණ ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා ජිනීවා හි බාසල් සම්මුති ලේකම් කාර්යාලයේ සහායෙන් උප ප්‍රාදේශීය පුහුණුවීම් සම්මන්ත්‍රණයක් ශ්‍රී ලංකාවේ පැවැත්වීමට කටයුතු පිළියෙල කෙරමින් පවතී. සාක් රටවල නියෝජිතයින්ද මෙම වැඩ සටහනට සහභාගීවනවා ඇත.

## පරිසර දූෂණය පාලනය පිළිබඳව ඉදිරි වැඩසටහන්

| යෝජිත කාර්‍යයන් | සැලසුම්කළ ඵළි දැක්ම. |
|---|---|
| 1. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය<br>ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීමේ සම්බන්ධීකරණය. | ජාතික මට්ටමින් සම්බන්ධීකරණය |
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමෝපායන් පළාත්පාලන ආයතන මට්ටමින් ඇතිකිරීමේ පහසුකම්. | පළාත්පාලන ආයතන විසින් එම මට්ටමින් පිළියෙල කරන ලද ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම් තිබීම. |
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට පුද්ගලික අංශ හා රාජ්‍ය නොවන සංවිධාන සහභාගීත්වය වැඩි දියුනු කිරීම. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාර්‍යයන් හි පුද්ගලික අංශ හා රාජ්‍ය නොවන සංවිධාන සහභාගීත්වය වැඩි දියුණු කිරීම. |
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ පර්යේෂන හා සංවර්ධනය වැඩි දියුනු කිරීම. | සුදුසු සේ සකස්කළ හැකි ක්‍රියාමාර්ග සමග ලියකියවිලි. |
| 2. නාගරික පරිසර දූෂණය පාලනය.<br>නාගරික පරිසර දූෂණය පාලනයට සම්බන්ධිත කාර්යයන් සම්බන්ධීකරණය කිරීම. | ජාතික මට්ටමේ සම්බන්ධීකරණය |
| ජාතික මට්ටමින් ගෙන ඇති තීරණ ක්‍රියාත්මක කිරීම. | ප්‍රතිපත්ති තීරණ ගැනීමට ලිය කියවිලි තිබීම |
| මූලික තොරතුරු රැස්කිරීම. | සුදුසු සේ සකස් කළ හැකි ක්‍රියාමාර්ග සමග ලියකියවිලි. |
| 3. කර්මාන්තමය දූෂණය පාලනය. | |
| කර්මාන්තමය දූෂණ කළමනාකරණ කාර්‍යයන් සම්බන්ධීකරණය. | ජාතික මට්ටමින් ප්‍රබල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම. |
| අමාත්‍යාංශ මට්ටමින් දූෂණය පාලන ප්‍රමිතීන් ආශ්‍රිත කාර්යයන් කරගෙන යෑම. | ප්‍රමිති මාලා මධ්‍යම පරිසර අධිකාරියෙහි තිබීම. |
| ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම පිණිස දූෂණය පාලනයට ආශ්‍රිතවූ මූලික තොරතුරු ඇතිකිරීම. | ප්‍රතිපත්ති සම්පාදනය පහසු කිරීම පිණිස මූලික දත්ත මූලයන් තිබීම. |
| දූෂණයට එරෙහිව ක්‍රියාත්මක වීමේ දී පුද්ගලික අංශ සහභාගීත්වය යොදාගැනීම. | වැඩි දියුනු කළ පුද්ගලික අංශ සහභාගීත්වය. |
| 4. ජාල ගත කිරීම.<br>දූෂණ පාලන කාර්යයන් පිළිබඳව ප්‍රබල සන්නිවේදන ක්‍රම ජාලයක් අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, වෙළඳ සංගම්, කර්මාන්ත, වෘත්තිකයින්ගේ සංගම්, පාරිසරික සමූහ හා මහජනතාව සමග ඇතිකර පවත්වාගෙන යෑම. | දැනුවත් බව ඇති කිරීම. දිරි ගැන්වීම් ලබා දීම, තාක්ෂණ ගුවමාරුව උනන්දු කිරීම, වැරදි වැටහීම් වලක්වා ගන්න, අඩු වියදම් ක්‍රමයට, කර්මාන්ත කාර්යක්ෂමතාව වැඩිදියුනු කිරීමට, හරිත මෝස්තර හුරු පුරුදු සම්පාදනය කර හරිත නිපයුම් අලෙවියට පාරිභෝගිකයන් ගේ උනන්දුව ඇති කිරීම. |
| 5. බාසල් සම්මුතිය ක්‍රියාත්මකකිරීම.<br>උපද්‍රවකාරී අපද්‍රව්‍ය දේශ සීමා හරහා ගෙනයාම පාලනය කිරීමේ හා අපහරණය කිරීමේ බාසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා පසු කාර්යයන්.<br>5.1.රටේ උපද්‍රවකාරී අපද්‍රව්‍ය අපහරණ පහසු කමක් ඇතිකිරීමට සම්බන්ධින කාර්‍යයන් පවත්වාගෙන යාම<br>5.2.උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණයට කාර්මික සහාය හා පුහුණුව ලබා දීම.<br>5.3.ආනයන හා අපනයන පාලනයට උපද්‍රවකාරී අපද්‍රව්‍ය රෙගුලාසි ඇතිකිරීම පහසු කිරීම.<br>5.4.බාසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ කාර්‍යයන් පිළිබඳව කර්මාන්ත කරුවන් හා වෙනත් පාර්ශව කරුවන් අතර දැනුවත් බවක් ඇති කිරීම.<br>5.5.බාසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ උප ප්‍රාදේශීය වැඩ මුළුවක් පැවැත්වීම. | බාසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීම හා රටේ පාරිසරිකව යහපත් උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණයක් සහතිකකිරීම. |

# ජෛව විවිධත්ව ඒකකය



පරිසර අංශයේ ජෛව විවිධත්ව ඒකකය ඇතිකරන ලද්දේ පහත දැක්වෙන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සහ විශේෂයෙන්ම ජෛව විවිධත්වයේ සංරක්ෂණය හා ධරණීය භාවිතය ඉටුකිරීම සඳහාය.

ජෛව විවිධත්ව ඒකකයේ 1998 ක්‍රියාත්මක කිරීමේ වැඩ සටහන මගින් පහත සඳහන් ප්‍රධාන කාර්‍ය්‍ය තුන, වසර ඒකක කාලයක් තුළදී සලකාබැලිය යුතු බව සැලකිල්ලට ගෙන ඇත.

- අන්තර් ආයතන සම්බන්ධීකරණය හා උපදේශක සේවා.
- ජෛව විවිධත්වය පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ විධි විධාන ක්‍රියාත්මක කිරීම.
- ජෛව විවිධත්ව ප්‍රතිපත්තිය සකස්කිරීම. (පස් අවුරුදු වැඩ සටහන)

## 1998 වසරේ කාර්‍ය්‍ය සාධනය

### අන්තර් ආයතන සම්බන්ධීකරණය හා උපදේශක සේවා.

- රැස්වීම් 06 ක් පැවැත්වින.
- ජෛව සම්පත් ආරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර සංධානය යලි සලකා බලන ලදි.
- ආක්‍රමණකාරී පැල පිළිබඳ ජාත්‍යන්තර ලැයිස්තුව යාවත් කාල කරන ලදි.
- ආක්‍රමණකාරී පැල පැතිරීම පිළිබඳ දත්ත මූලය යාවත් කාල කරන ලදි.
- වෙනස්ව ජීවත්වෙන ජීවීන් අපනයනයේ නෛතික තත්ත්වය යලි සලකා බලන ලදි.
- ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්මේ (1998-2003) යාවත් කාලීන කිරීමේ කාර්‍ය්‍යයේදී වන සම්පත් හා ජෛව විවිධත්වය පිළිබඳව වූ පරිච්ජේදය යලි සලකා බලන ලදි.
- ජල රසායන මිශ්‍ර කොරල් හුණු සඳහා ආදේශයක් වෙනුවෙන් පර්යේෂණ වැඩ සටහන් කරන ලදි.
- ජල රසායන මිශ්‍ර කොරල් හුණු භාවිතය පාලනය කිරීමේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සඳහා ක්‍රියාවන් මූලාරම්භ කරන ලදි.

### ජෛව විවිධත්ව ප්‍රතිපත්තිය සකස්කිරීම (පස් අවුරුදු වැඩ සටහන)

- ජෛව විවිධත්ව සංරක්ෂණ ක්‍රියාකාරී සැලැස්මේ කාර්‍ය්‍ය රාමුව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා ගැනීන.
- ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා අංශයීය ප්‍රමුඛතා හඳුනා ගන්නා ලදි.

### ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම.

- කෘෂි කාර්මික ජෛව විවිධත්වයේ සංරක්ෂණය සහ තිරසාර භාවිතය සඳහා ජාතික ප්‍රතිපත්තියක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට වැඩ මුළුවක් පැවැත්වීම.
- මුහුදු, වෙරළබඩ, හා තෙත් බිම් ජෛව විවිධත්වයේ සංරක්ෂණය හා තිරසාර භාවිතය සඳහා ජාතික ප්‍රතිපත්තියක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට වැඩ මුළුවක් පැවැත්වීම.

- වනසම්පත් හා ආරක්ෂිත ප්‍රදේශයන්හි ජෛව විවිධත්වයේ සංරක්ෂණය හා තිරසාර භාවිතය සඳහා ජාතික ප්‍රතිපත්තියක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට වැඩ මුළුවක් පැවැත්වීම.

## ජෛව විවිධත්වය සඳහා අධ්‍යාපනය හා දැනුවත් බවේ වැඩ සටහන් පැවැත්වීම.

- ජෛව විවිධත්ව ක්ෂේත්‍ර අධ්‍යයන වැඩසටහන් තුනක් පවත්වන ලදී.(බේරුවල, වැවේකැලේ හා අනුරාධපුර)

- ආක්‍රමණකාරී පැල (මිමෝසා පිග්‍රා) පිළිබඳ දැනුවත් බවේ වැඩ සටහනට අනුග්‍රහ දැක්වීම.

## රාජ්‍ය නොවන සංවිධාන කායර්යන් සඳහා දායකත්වයක් සපයා දීම.

- ආක්‍රමනකාරී පැලයේ (හෝර්ටන් තැන්නේ යුලෙක්ස් යුරෙපස්) පැතිරීම සිතියම් කරණය සම්පූර්ණ කිරීම.

- මධ්‍යම පළාත සඳහා ප්‍රාදේශීය ජෛව විවිධත්ව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට වැඩ මුළුවක් පැවැත් වීම.

- ජෛව විවිධත්ව ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට වැඩ මුළුවක් පැවැත්වීම.

## ජෛව විවිධත්වය පිළිබඳ සම්මුතියේ විධි විධාන ක්‍රියාත්මක කිරීම.

- ජෛව විවිධත්ව පරයේෂණ සඳහා ආචාර ධර්ම සංග්‍රහයක් පිළියෙල කිරීමට ක්‍රියාකිරීම.

- ජෛව සම්පත් ආරක්ෂාකිරීම සඳහා ජාතික මාර්ගෝපදේශ පිළියෙල කිරීම සඳහා උප කමිටුවක් ඇතිකර ක්‍රියාකරන ලදි.

- රටේ ජාන සම්පත් ආරක්ෂා කිරීම සඳහා වූ නෛතික කායර් රාමුව සමාලෝචනය කිරීමට උප කමිටුවක් ඇති කර ක්‍රියාකරණ ලදි.

## ක්‍රියාත්මක සැලැස්ම - 1999

* ජෛව විවිධත්ව සංරක්ෂණ ක්‍රියාකාරී සැලැස්මේ කායර් රාමුව මත පාදක වූ පස් අවුරුදු ජෛව විවිධත්ව වැඩ සටහනක් (ප්‍රතිපත්ති) පිළියෙල කිරීම.

* ජෛව විවිධත්වය පිළිබඳ සම්මුතියේ විධි විධාන ක්‍රියාත්මක කිරීම.

## ඉහත සඳහන් කරුණුවල උප කායර්යන් වනුයේ.

- අන්තර් ආයතන සම්බන්ධීකරණය හා උපදේශක සේවාවන්

- ජෛව විවිධත්වයේ ධරණීය භාවිතය හා සංරක්ෂණයේ වර්තමාන තත්ත්වයේ තක්සේරුව සඳහා කෙටිකාලීන අධ්‍යයනයන්


- දැනුවත් බව වර්ධනය කිරීමේ වැඩ සටහන්

- අංශයීය වැඩමුළු / සම්මන්ත්‍රණ.

- ව්‍යාපෘති යෝජනා සකස්කිරීම

- ජෛව විවිධත්ව සංරක්ෂණය හා එහි ධරණීය භාවිතය මෙන්ම අපේ ජෛව විවිධත්වය පාදකව පරයේෂණ හා තාක්ෂණික දියුණුවෙන් එකතු වන්නා වූ ප්‍රතිලාභ සමව බෙදා ගැනීම ද සඳහා අවශ්‍ය ආයතනනික හා නෛතික කායර් රාමුව ශක්තිමත් කිරීම යනාදියයි.

# නොරාඩ් පාරිසරික සහයෝගිතා වැඩ සටහන



නෝර්වීපියානු පාරිසරික ආධාර වැඩසටහනේ පළමු අදියරේ අවසන් වසර 1998 වේ. මෙම අවුරුද්ද සඳහා මුළු වෙන්කිරීම රුපියල් දශලක්ෂ 10.8 ක් වේ. 1998 වසර සඳහා පවත්වාගෙන යන ව්‍යාපෘති 13 ක් තිබේ.

## 1998 වසරේ කාර්‍ය්‍ය සාධනය

1. කඩොලාන කළමනාකරණය.
2. කෘෂි රසායන හා පරිසර ආරක්ෂාව.
3. මෙතිල් බ්‍රෝමයිඩ් අදියර ගත කිරීම.
4. කුණු කසළ දිරවීම.
5. නාගරික ස්වාභාවික සම්පත්.
6. ක්ෂේත්‍ර මධ්‍යස්ථානය - සීගිරිය.
7. රුක් විශේෂීන් වල ජෛව තාක්ෂණය.
8. සිංහරාජ හා නකල්ස්.
9. වැවේකැලේ ස්වාභාවික රක්ෂිත ප්‍රදේශය.
10. සීගිරිය ඔසු පැලෑටි උද්‍යානය.
11. බුන්දල ජාතික උද්‍යානය.
12. අධ්‍යයන හා සමාලෝචන.
13. වනසම්පත් හා පරිසර අමාත්‍යාංශය ආයතනික වශයෙන් ශක්තිමත් කිරීම.

1999 දී සම්පූර්ණ කෙරෙන ව්‍යාපෘති දෙකක් හැරෙන්නට මෙම සියළු ව්‍යාපෘති නිමවෙමින් පවතී. මෙම සියළුම ව්‍යාපෘති නොර්වීපියානු ආර්ථික සහයෝගිතා වැඩ සටහනේ ප්‍රධාන කේන්ද්‍ර හයක් යටතට ගැනේ. එනම්,

1. ආයතනික ගොඩ නැගීම හා පුහුණුව.
2. පාරිසරික රැකවරණය හා කලමනාකරණය.
3. පාරිසරික දූෂණය.
4. පාරිසරික අධ්‍යාපනය හා දැනුවත් බව ඇති කිරීම.
5. පාරිසරික පර්යේෂණ හා සැලසුම් කරණය.
6. ස්වාභාව රැකවරණය.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරගෙන යනු ලබන කඩොලාන කලමනාකරණය වැදගත් ව්‍යාපෘතියකි. රටේ කඩොලාන සම්පත් ධරණීය අයුරින් කළමනාකරණය කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමෙන්තුවේ කාර්මික හැකියාවන් වැඩි දියුනු කිරීම මෙම ව්‍යාපෘතියේ දීර්ඝකාලීන අරමුන වේ. මෙම අරමුණ කරා යාමේ කෙටි කාලීන ඉලක්ක නම් ප්‍රතිපත්ති නිර්දේශකර සකස් කිරීම හා පවතින නීති පිරික්සා බැලීම, ශ්‍රී ලංකාවේ කඩොලාන සම්පත් සඳහා සංරක්ෂණ කලමනාකරණ සැලැස්මක් පිළියෙල කිරීම හා සංරක්ෂණ කලමනාකරණ සැලැස්ම සකසා ක්‍රියාත්මක කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීමය. මෙම ව්‍යාපෘතිය නිමවෙමින් පවතී.

සීගිරිය ඔසු පැලෑටි උද්‍යානය හා වන රුක් තවාන වැඩි දියුනු කිරීමත් පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය (කොළඹ) විසින් ක්‍රියාත්මක කරන ලද තවත් ව්‍යාපෘතියකි. මාර්ගෝපදේශ පොත් පල කිරීම හැරෙන්නට සියළුම කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් නිමවා ඇත්තේය.

### නාගරික ස්වාභාව රක්ෂිත පාරසරික අධ්‍යයන කේන්ද්‍ර


මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ ද්වීතීය ශ්‍රේණි වල පාසල් ළමුන්ට නාගරික ස්වභාවරක්ෂිත උපයෝගී කරගනිමින් ප්‍රායෝගික පාරිසරික අධ්‍යපන කටයුතු වැඩිදියුණු කර ගැනීමට අවස්ථාව සැලසීමටය. මෙම ව්‍යාපෘතිය යටතේ සියළුම වැඩසටහන් සම්පූර්ණ කර ඇත්තේය.

### කෘෂි කර්මාන්තයේ දී කෘෂි රසායන භාවිතය අඩු කිරීම තුළින් පාරිසරික රැකවරණය.

මෙය දැනට පවත්වාගෙන යන ව්‍යාපෘතියක් වන අතර 1වැනි, 2වැනි හා 3වැනි කාර්තුවල ඉලක්ක සපුරා තිබේ.

මෙතිල් බ්‍රෝමයිඩ් අදියර ගත කිරීම ද පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘතියක් වන අතර සාර්ථකව ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

රුක් විශේෂීන් වල ජෛව තාක්ෂණය - වැවකැලේ බුන්දල ජාතික උද්‍යානය ද පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘති



වන අතර සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

රාජකීය නෝර්වීජියානු තානාපති කර්යාලයෙන් මුළු අධාර දීමනාව 1998 දී රුපියල් දශලක්ෂ 10.8 කි. කලින් වෙන්කිරීමෙන් ඉතිරිය රුපියල් දශලක්ෂ 4 කි. මේ දක්වා වියදම රුපියල් 10.7 කි.

## ක්‍රියාත්මක සැලැස්ම -1999

ව්‍යාපෘතියේ නව අදියරයක් 1999 දි ඇරඹීමට අමාත්‍යාංශයේ නොරාඩ් ඒකකය බලාපොරොත්තුවේ. 1998 .10 .20 දින පැවති නගර රැස්වීමේදී දෙරට එකග වු පරිදි අමාත්‍යාංශය විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා නව වැඩ සැලැස්මක් හා ආදර්ශයක් රාජකීය නෝර්වීජියානු තානාපති කාර්යාලය වෙත ඉදිරිපත් කළාය. පහත සඳහන් අංශ යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ආදර්ශය බලාපොරොත්තුවේ.

1. උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය.
2. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.
3. කර්මාන්තමය දූෂණය.
4. අධ්‍යයන හා සමාලෝචන.
5. නාගරික ස්වාභාව රක්ෂිත.

ආදර්ශයේ නව අදියරයන් සඳහා රාජකීය නෝර්වීජියානු තානාපති කාර්යාලයේ අනුමතිය අමාත්‍යාංශයට ලැබුණුවිට වනසම්පත් හා පරිසර අමාත්‍යාංශය ඉහත සඳහන් ප්‍රභේදයන් යටතේ යෝජනා ඉදිරිපත් කරනු ඇත.

# ප්‍රථම පාරිසරික ක්‍රියාකාරී ව්‍යාපෘතිය

ප්‍රථම පාරිසරික ක්‍රියාකාරී ව්‍යාපෘතිය ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන වර්ෂ 5 ක කාලයක් සඳහා වු ව්‍යාපෘතියකි. මෙය 1998 වසරේ පෙබරවාරි මාසයේ සම්මුතියකට එළඹ එම වර්ෂයේම ජුලි 22 දින ක්‍රියාවට නැංවුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කළ මුදල රුපියල් මිලියන 1322 (ඇ.ඩො. මිලියන 20.8 ) කි. මෙම ව්‍යාපෘතියේ එක් අංශයක් වන ප්‍රජාපාරිසරික ප්‍රාරම්භන වැඩ සටහනට ( CEIF ) ආධාර කිරීමට නොරාඩි පාරිසරික සහයෝගිතා වැඩසටහන එකග වී ඇත.

## *අරමුණු*

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ පරිසරය ආශ්‍රිත ප්‍රතිපත්ති සැලසුම් කිරීම හා වන සම්පත් හා පරිසර අමාත්‍යාංශයේ පරිසර අංශය, මධ්‍යම පරිසර අධිකාරිය හා පරිසර කළමනාකරණයට සම්බන්ධ අනෙකුත් ආයතන සවිමත් කිරීමයි. ව්‍යාපෘතිය ප්‍රධාන කොටස් (උප ව්‍යාපෘති ) තුනකින් යුක්තය.

1. පරිසර කළමනාකරණයට අදාල ආයතන සවිමත් කිරීම. මෙයට කාර්යාල සංකීර්ණයක් ගොඩ නැගීම හා එම ආයතන වලට අවශ්‍ය වාහන ඇතුළු අනෙක් භාන්ඩ මිලදී ගැනීම අයත් වේ.


2. ප්‍රජා පාරිසරික ප්‍රාරම්භන වැඩ සටහන. ( CEIF)

3. කුඩා ජල පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරීම - මෙය නියාමක ව්‍යාපෘති අංගයක් වන අතර, මධ්‍යම පළාතේ කුඩා ජල පෝෂක ප්‍රදේශ 10 ක් මේ සඳහා යොදාගෙන ඇත.

## 1998 වසරේ කාර්‍ය සාධනය

1. පරිසර කළමනාකරණයට අදාල ආයතන සවිමත් කිරීම. වන සම්පත් හා පරිසර අමාත්‍යංශයේ පරිසර අංශයේ ප්‍රතිපත්ති හා සැලසුම් අංශයක් පිහිටුවීම. මෙය වසරේ මුල් භාගයේ සිදුකරන ලද අතර, අවශ්‍ය නිලධාරීන් ද (නියෝජ්‍ය අධ්‍යක්ෂවරු දෙදෙනෙක් හා අධ්‍යක්ෂවරයෙක්) පත් කරන ලදි.

2. ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදනයට අදාල අධ්‍යයනයන් 19 ක් සිදු කරන ලද අතර ඒවා පහත සඳහන් අංශ වලට අදාල කෙරිනි.



- ✳ භූමිය හා ජල සම්පත් .
- ✳ වන සම්පත් හා ජෛව විවිධත්වය.
- ✳ නාගරික කර්මාන්ත වලින් සිදුකෙරෙන පරිසර දූෂණය.
- ✳ මුහුද හා වෙරළ ආශ්‍රිත සම්පත්.
- ✳ බල ශක්තිය හා ඛණිජ සම්පත්.
- ✳ පාරිසරික සෞඛ්‍යය.

මෙම අංශ වලට අදාලව කරන ලද අධ්‍යයන කටයුතු 19 ක් අවසන් කර ඇති අතර, එම අධ්‍යයන වලින් උකහා ගත් කරුණු මත පරිසර ප්‍රතිපත්ති සම්පාදනය කර ඇත. දැනට මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය වෙමින් පවතී. තවත් නව අධ්‍යයන 10 ක් කිරීමට සැලසුම් කර ඇති අතර, ඒ සඳහා දැනට මූලික කටයුතු සම්පාදනය කර ඇත. මෙම නව පරිසර ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාවට නැංවීම පරිසර සංරක්ෂණයට මහගු පිටුවහලක් වනු ඇත.

3. අමාත්‍යාංශයේ පරිසර අංශය ප්‍රති සැලසුම් කිරීමේ කටයුතු නිම කර ඇති අතර, මධ්‍යම පරිසර අධිකාරිය ප්‍රති සැලසුම් කිරීම කෙරෙමින් පවතී. මෙහි මූලික පරමාර්ථය වනුයේ කාර්යක්ෂම පරිසර කළමනාකරණයක් ඇති කිරීමයි. මේ යටතේ පරිසර අංශයට සහ මධ්‍යම පරිසර අධිකාරියට නිලධාරීන් පත් කිරීම ද සිදු කෙරේ.

4. මෙම වසරේ පරිසර ආශ්‍රිත නිලධාරීන් 10 ක් පත් කළ අතර ඔවුන් අනෙකුත් අමාත්‍යාංශ වලට අනුයුක්ත කොට ඇත.

වසර අවසන් වීමට පෙර තවත් පරිසර ආශ්‍රිත නිලධාරීන් 15 ක් බඳවා ගැනීමට නියමිතය. ඒ සඳහා අවශ්‍ය කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී. මේ අනුව 1998 වසර අවසානයේ මෙම ව්‍යාපෘතිය යටතේ රැකියා අවස්ථා 40 ක් පමණ සුදුසු කම් ලත් අය හා උපාධිධාරීන් වෙනුවෙන් ලබා දීමට ඉඩ සලසා ඇත.

5. ජාතික පාරිසරික ක්‍රියාත්මක සැලැස්ම යාවත් කාලීන කිරීමේ වැඩ අවසන් කර ඇති අතර, එය රජයේ ඉදිරි පරිසර ප්‍රතිපත්ති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රධාන ලේඛනය වනු ඇත.

6. මෙම ශෝධිත සැලසුම් ක්‍රියාත්මක කිරීමේ මූලික වැඩ කටයුතු දැනට කෙරෙමින් පවතින අතර මෙය සිදු කෙරෙනුයේ අළුතින් පිහිටුවන ලද පරිසර ප්‍රතිපත්ති හා කළමනාකරණය සම්බන්ධ කමිටුව හරහා ය. (CEPOM)

7. මානව සම්පත් සංවර්ධනයට සම්බන්ධ - පුහුණු වැඩ සටහන් නිර්මාණය කර අවසන් අතර, එවා නිලධාරීන් හා අනෙකුත් පිරිස පරිසරය පිළිබඳ දැනුවත් හා පුහුණු කිරීමට මහඟු පිටුවහලක් වනු ඇත.

8. මධ්‍යම පරිසර අධිකාරියේ යම් යම් වැඩ කොටස් වෙනත් ආයතන වලට පැවරීමට ඇති හැකියාව සොයා බැලීමට අධ්‍යයනයක් සිදු කරමින් පවතී. මෙ මගින් මධ්‍යම පරසර අධිකාරියේ මූලික කාර්ය භාරය වන පරිසර විනාශයට එරෙහිව නීතිමය පියවර ගැනීමේ ක්‍රියාවලිය සිදුකිරීම පහසු වනු ඇත.

9. විදේශ ආධාර සමායෝජනය ( Donar - Cordination) සම්බන්ධ අධ්‍යයනයක් ආරම්භ කර ඇත. මෙ මගින් ආධාර ප්‍රයෝජනවත් ලෙස යොදා ගැනීමටත් එකම ව්‍යාපෘතිය නැවත නැවත සිදුකිරීම වලකා ගැනීමටත් ඉඩ සැලසේ

10. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ අධ්‍යයන යටතේ එම ආයතන පුහුණු කිරීමටත් එමගින් රාජ්‍ය නොවන ආයතන අර්ථවත් පරිසර සංරක්ෂණය කෙරෙහි යොමු කිරීමටත් කටයුතු සිදුකෙරෙනු ඇත.

11. කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීම.

මෙම ප්‍රථම පාරිසරික ව්‍යාපෘතිය යටතේ වන සම්පත් හා පරිසර අමාත්‍යාංශයේ පරිසර අංශය හා මධ්‍යම පරිසර අධිකාරිය එකම ගොඩනැගිල්ලක පවත්වාගෙන යෑම මගින් කාර්යක්ෂම තාවය වැඩි කිරීම මෙම නව කාර්යාල සංකීර්ණය ගොඩ නැගීමේ අරමුනයි. මෙය තට්ටු 4 ක ගොඩ නැගිල්ලකි. ඉඩ ප්‍රමාණය වර්ග අඩි 75,000 ක් වන අතර, බත්තර මුල්ලේ අක්කර දෙකක භූමිභාගයක එහි වැඩ නිමවෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල රුපියල් මිලියන 150 කි. ගොඩනැගිල්ල පරිසර හිතකාමී ආකාරයට නිමකිරීමට සැලසුම් කර ඇත. දැනට මෙම ව්‍යාපෘති අංශය සාර්ථකව යෝජිත කාල සැලැස්මට ඉදිරියෙන් කෙරීගෙන යයි. මේ සඳහා මේ දක්වා (සැප්තැම්බර් 30) රුපියල් මිලියන 40 ක් වැය කර ඇත.

වාහන පරිගණක ඇතුළු අනෙකුත් කාර්යාල අවශ්‍යතාවයන් අවශ්‍යතාවයන් සඳහා උපකරණ මිලදී ගැනීම. මේ යටතේ මේ වසර අගභාගයේ දී අවශ්‍ය වාහන පරිණනක හා අනෙකුත් අවශ්‍ය භාන්ඩ මිලදී ගැනීමට සැලසුම් සකස් කර ඇත.

12. කුඩා ජල පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරීම.

(අ) කුඩා ජල පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරීම මගින් වගා කටයුතු වැඩිදියුනු කිරීම හා පාංශු ඛාදනය වැලැක්වීම.

(ආ) ප්‍රදේශ වාසීන් ගෙ සහයෝගය ඇතිව කුඩා ජල පෝෂක ප්‍රදේශ සංවර්ධන කිරීම හා නඩත්තු කිරීමේ හැකියාව සොයා බැලීම.

(ඇ) මෙම ව්‍යාපෘති, අනෙකුත් ප්‍රදේශ වලට ව්‍යාප්ත කිරීමට ඇති හැකියාව සොයා බැලීම. මේ යටතේ මධ්‍යම පළාතේ ජල පෝෂක ප්‍රදේශ 10 ක් තෝරාගෙන ඇති අතර, මෙම ප්‍රදේශ දඟය දුංකොළ වගාව, හේන් ගොවිතැන හා දුර්වල කලමනාකරණයන් නිසා අධික ලෙස පාංශු ඛාදනයට ලක් වූ ප්‍රදේශ වේ.

මෙම ප්‍රදේශ 10 මධ්‍යම පළාතේ, මහනුවර, නුවරඑළිය , හා මාතලේ යන දිස්ත්‍රික්කවලට අයත් වේ.

දැනට ජල පෝෂක ප්‍රදේශ 9 ක සංවර්ධන කටයුතු සාර්ථකව කෙරීගෙන යන අතර අනෙකුත් ජල පෝෂක ප්‍රදේශය සංවර්ධනය සඳහා රාජ්‍ය නොවන සංවිධානයකට දෙසැම්බර් මස 31 දිනට පෙර බාරදීමට කටයුතු යොදා ඇත.

මෙම උප ව්‍යාපෘති යටතේ කෘෂිකාර්මික හා කර්මික පාංශු සංරක්ෂණ ක්‍රම යොදාගෙන ඇති අතර, ගම් වාසීන්ට මෙම ක්‍රම යොදැනීම වෙනුවෙන් ගෙවීමක් කරනු ලැබේ. SALT වැනි කෘෂිකාර්මික පාංශු සංරක්ෂණ ක්‍රම සඳහා මෙහිදී ගම්වාසීන් උනන්දු කිරීම කෙරේ.

(i). තවද පුහුණු කිරීමේ වැඩ මාලාවක් සකසා ඇති අතර, මේ යටතේ ගොවීන්, ක්ෂේත්‍ර නිලධාරීන් හා උසස් නිලධාරීන් පුහුණු කිරීමට යෝජිතව ඇත. දැනට මෙම වසර තුළදී සාර්ථකව වැඩමුළු රාශියක් පවත්වා ඇත.

(ii). කුඩා ජල පෝෂක ප්‍රදේහ සංවර්ධනය සඳහා ආකෘති කීපයක් හඳුන්වා දී ඇති අතර එමගින් ජනතා සහයෝගය උපරිම කර ඇත.

(iii) මේ යටතේ ගොවි කේන්ද්‍ර ගොඩ නැගීමට මූලික කටයුතු සම්පාදනය කර ඇති අතර මෙම කේන්ද්‍ර නිෂ්පාදන විකුණාගැනීම, රැස්වීම් පැවැත්වීම, ප්‍රදර්ශන පැවැත්වීම ආදිය සඳහා යොදාගැනීමට සැලසුම් කර ඇත.

(iv). පැලතවාන් රාශියක් මෙම උප ව්‍යාපෘතිය යටතේ ආරම්භ කර ඇත.

මෙම උප ව්‍යාපෘතියේ සාර්ථකත්වය ලෝක බැංකුවේ ප්‍රශංසාවට ලක්වී ඇති අතර, මෙ මගින් එම ප්‍රදේශ වල පාරවල් හා මංමාවත් සංවර්ධනය ප්‍රදේශ වාසීන්ගේ උනන්දුව හා උද්‍යෝගය මත ඔවුන්ගේ ශ්‍රමයෙන් කෙරෙමින් පවතී. මේ යටතේ සැප්තැම්බර් 30 දක්වා රුපියල් මිලියන තුනක මුදලක් වැඩි කර ඇත.

(13) ප්‍රජා පාරිසරික ප්‍රාරම්භන වැඩ සටහන

මෙ මගින් ප්‍රජාව, රජය හා රාජ්‍ය නොවන සංවිධාන පරිසර සංවර්ධනය හා කළමනාකරණ ව්‍යාපෘතිවලට යොමු කිරීමට අරමුණු කර ඇත. මෙම ව්‍යාපෘති පහත සඳහන් අංශ වලට අදාලව සිදු කෙරේ.

- භූමිය හා ජල සම්පත්
- වන සම්පත හා ජෛව විවිධත්වය
- නාගරික පරිසර දූෂණය
- වෙරළ හා සාගර සම්පත්
- බලශක්තිය හා ඛනිජ සම්පත්
- පාරිසරික සෞඛ්‍යය.

1998 වසර සඳහා ව්‍යාපෘති 60 කට මුදල් හා අනෙකුත් ආධාර සපයා ඇති අතර, දෙවැනි වටය සඳහා අයදුම් පත් කැඳවා ව්‍යාපෘති අනුමත කිරීමේ කටයුතු දැනට කෙරෙමින් පවතී.

• දැනට දැනුවත් කිරීමේ වැඩමුළු 10 ක් පමණ විවිධ දිස්ත්‍රික්ක වල පවත්වා ඇත.

දිස්ත්‍රික් මට්ටමේ ව්‍යාපෘතියක් දියත් කිරීමට මෙ මගින් (CEIF) සැලසුම් කර ඇති අතර, දැනට එය සංශෝධනය කිරීමේ කටයුතු කෙරෙමින් පවතී.

මෙම ව්‍යාපෘතිය යටතේ සැප්තැම්බර් 30 දක්වා රුපියල් මිලියන 9 ක් වැය කර ඇත.

## ක්‍රියාත්මක සැලැස්ම -1999

මෙම වැඩසටහන මගින් 1999 දී පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීමට සැලැසුම් කර ඇත.

1. අමාත්‍යාංශයේ හා මධ්‍යම පරිසර අධිකාරියේ කටයුතු ප්‍රති සැලසුම් කිරීම තවදුරටත් කාර්යක්ෂම කිරීම මෙ මගින් විධිමත් පරිසර කලමනාකරණයක් කිරීමට බලාපොරොත්තු වේ.

2. රජයේ සංවර්ධන කටයුතු වලට පාරිසරික අංශයන් ඇතුළත් කිරීම.

3. පරිසර දූෂණය අවම කිරීම හා ප්‍රජාව පරිසර සංරක්ෂණයට හා පරිසර කලමනාකරණයට යොමු කිරීම.

පාරිසරික ආයතන සවිමත් කිරීම යටතේ 1999 වසර සඳහා අධ්‍යක්ෂ වරුන් 3ක් ඇතුළු තවත් කාර්ය මණ්ඩල සාමාජිකයන් බඳවා ගැනීමට සැලසුම් කර ඇත. දැනට සැලසුම් කර ඇති අධ්‍යක්ෂ තනතුරු -

අධ්‍යක්ෂ- ප්‍රතිපත්ති හා සැලසුම්

අධ්‍යක්ෂ-ජෛව විවිධත්වය

අධ්‍යක්ෂ- කැලිකසළ කලමනාකරණය


මේ අනුව දල වශයෙන් නිලධාරීන් 20ක් පමණ 1999 වසර තුළ දී අනුයුක්ත කිරීමට අදහස් කර ඇත.

2. ප්‍රතිපත්ති හා සැලසුම් වලට අදාල නව අධ්‍යයන 10ක් මෙම වසරේදී නිම කිරීමට බලාපොරොත්තුවේ.

3. ජාතික පාරිසරික ක්‍රියාත්මක සැලැස්ම මගින් පරිසර සංරක්ෂණ ප්‍රතිපත්ති හඳුන්වා දීම සිදු කිරීමට තීරණය කර ඇත.

4. බඳවා ගනු ලබන පරිසර ආශ්‍රිත නිලධාරීන් 15 ක් පුහුණු වීමේ කටයුතු වලින් පසු අනෙකුත් අමාත්‍යාංශ වලට අනුයුක්ත කිරීම සිදුකරනු ලැබේ.

5. මානව සම්පත් සංවර්ධනයට අදාල සැලසුම් 1999 වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට කටයුතු කෙරේ.



6. සංවර්ධන ප්‍රතිපත්තියට පරිසරය සමායෝජනය කිරීමේ කමිටු රැස්වීම් 1999 දී ද, පැවැත්වීමට නියමිත අතර ඒ මගින් පරිසරය ආර්ථික සංවර්ධනය සමග සම තුළිතව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම කරනු ලැබේ.

7. විදේශාධාර සමායෝජනය, හා රජ්‍ය නොවන සංවිධාන වැඩ සටහන දියත් කිරීම ද1999 වසරේ සිදු කෙරේ.

8. දැනට ඉදිකෙරෙමින් පවතින කාර්යාල සංකීර්ණයේ කටයුතු 1999 වසරේදී අවසන් කිරීමට යෝජිතය.


1999 වසර සඳහා අවශ්‍ය වාහන, පරිගණක, හා අනෙකුත් ද්‍රව්‍ය මිලදී ගැනීමට සැලසුම් කර ඇත.

9. ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශ සංවර්ධනය
දැනට කෙරීගෙන යන සංවර්ධන කටයුතු තවදුරටත් කිරීමට සැලසුම්කර ඇති අතර ගොවි කේන්ද්‍ර ඉදිකිරීම හා විද්‍යාත්මක පර්යේෂණ කටයුතු මෙම ප්‍රදේශ වල ආරම්භ කරනු ඇත.

10. ප්‍රජා පාරිසරික ප්‍රාරම්භන වැඩ සටහන, 1999.
නව ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම, සහ දැනට කෙරීගෙන යන ව්‍යාපෘති සමීක්ෂණය 1999 වසරේදී සිදු කෙරෙනු ඇත. ඊට අමතරව දිස්ත්‍රික් මට්ටමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ද අදහස් කර ඇත.

මෙම උප ව්‍යාපෘති වලට අමතරව ප්‍රථම පාරිසරික ව්‍යාපෘතිය මගින් වැඩ මුළු, සහ විදේශීය හා දේශීය පුහුණු කිරීම් සඳහා ද මුදල් වෙන් කරනු ඇත.

# මොන්ට්‍රියෙල් සන්ධාන ඒකකය



*අරමුණ:*

කර්මාන්ත හා වෙළෙඳාමෙහි ඕසෝන් හානි කාරක ද්‍රව්‍ය ඉවත් කිරීම.

## 1998 වසරේ කාර්‍ය සාධනය

1. දත්ත රැස්කිරීම.

1997 වසර සඳහා ඕසෝන් හානිකාරක ද්‍රව්‍ය පරිභෝජනය පිළිබඳ දත්ත රැස්කිරීම සම්පූර්ණ කරන ලදි. ක්ලෝරෝ ෆ්ලුරෝ කාබන් ද්‍රව්‍යයන් වල මුළු පරිභෝජන එකතුව ටොන් 184 ක් වූ අතර හයිඩ්‍රෝ ක්ලෝරෝෆ්ලෝරෝ කාබන් ද්‍රව්‍යයන් වල මුළු එකතුව ටොන් 287 ක් විය. කලින් වසරේ ක්ලෝරෝෆ්ලෝරෝ කාබන් පරිභෝජනය වූ ටොන් 507 හා සසඳා බලන කළ අඩුවීමක් දක්නට ලැබේ.

2. දැනුවත් කිරීමේ වැඩ සටහන්.

වැඩ සටහන් කීපයක් පිට පළාත්වල පවත්වන ලදී. (තලාව, අනුරාධපුර, ගාල්ල, හා මාතර) මේ, ඕසෝන් ස්ථරය හීනවීම පිළිබඳ අළුත්ම තත්ත්වය ජනතාවට දැක්වීමටත්, ඕසෝන් හානිකාරක ද්‍රව්‍ය හා ඒවා භාවිතා කළ හා කෙරෙන උපකරණ පිළිබඳව ගත් පාලන ක්‍රියාමාරග පිළිබඳ දැන්වීමටත් ය.

"ක්ලෝරෝ ෆ්ලෝරෝ කාබන් අදියරගත කිරීම හා තුන්වැනි ලෝකයේ රටවලට එහි ඇති බලපෑම" "හරිතාගාර ආවරණය හා ඕසෝන් හානි කරණය" "ඕසෝන් හානිකාරක ද්‍රව්‍ය පාලනයේ දී මුහුණපාන මාධ්‍ය සංනිවේදන ගැටළු" "විකල්ප ශීතකාරක හා ඒවායේ ඵලදායිතාව" "මිහිතල දේශගුණය හා ඕසෝන් ස්ථරයේ රැකවරණයට ජාතීන් විසින් යොදා ගෙන ඇති සමුළු හා සන්ධාන" වැනි කරුණු මෙම සම්මන්ත්‍රණ වලදී අවධාරණය කරණ ලදි.

මීට අමතරව, "ශීතකරණ අංශයට මොන්ට්‍රියල් සන්ධාන පාලනවල ඇති බල පෑම" මැය යටතේ සජීවී ගුවන් විදුලි සාකච්ඡා දෙකක් පවත් වන ලදි.

ඕසෝන් ස්ථරය හා එහි හා ක්ෂයවීම සහ විකල්ප ශීතකාරක පිළිබඳ තොරතුරු ඉල්ලීම් කීපයක් මහජනතාගෙන්, පාසල් ළමුන් හා ශීතකරණ කාර්මිකයින්ගෙන් ද ලැබුන අතර ඒවා සපයන ලදි.

3. ජාත්‍යන්තර ඕසෝන් දින සැමරීම.

ජාත්‍යන්තර ඕසෝන් දිනය වෙනුවෙන් පහත සඳහන් පරිදි කාර්‍යයන් කීපයක්ම සංවිධානය කරන ලදි.

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා එකමුතුව දීප ව්‍යාප්ත ළමා චිත්‍ර තරගයක් සංවිධානය කරණ ලදි. එක් දිස්ත්‍රික්කයකින් තෝරාගත් හොඳම චිත්‍ර 20 බැගින් ගෙන ඒවා සැප්තැම්බර් 6 සිට 8 දක්වා ශ්‍රී ලංකා පදනම් ආයතනයේ ප්‍රදර්ශනය කරණ ලදි. ත්‍යාග ප්‍රදානය කරණ ලද්දේ ගරු වන සම්පත් හා පරිසර අමාත්‍යතුමා හා ගරු අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යතුමා විසිනි. හොඳම චිත්‍රය පැරීසියේ පැවැත්වූ තරගයට ඉදිරිපත් කෙරින. මීට අමතරව රාජ්‍ය නොවන සංවිධාන හා ජනමාධ්‍ය වේදීන් සඳහා වූ සම්මන්ත්‍රණයක් ද සව්සිරිපායේදී පවත්වන ලදි. තවද විද්‍යුත් මාධ්‍යයන් හා මුද්‍රිත මාධ්‍යයන් මගින් ඕසෝන් ස්ථරය පිළිබඳ තොරතුරු ප්‍රචාරය කිරීමට ද විධිවිධාන යොදන ලදි. ඕසොන් පුවත් නමින් විශේෂ පුවත් ප්‍රකාශනයක් මුද්‍රණය කර බෙදා හැරිනි.

4. ප්‍රකෘතිමත් කිරීමේ සහ ප්‍රතිචක්‍රිය කරණය කිරීමේ ව්‍යාපෘතිය.

මෙම ව්‍යාපෘතිය යටතේ ක්ලෝරෝ ෆ්ලුරෝ කාබන් ප්‍රකෘතිමත් කිරීමේ මධ්‍යස්ථාන 100 ක් හා ප්‍රතිචක්‍රියකරණය කිරීමේ මධ්‍යස්ථාන 8 ක් පිහිටුවන ලදි. කාර්මිකයන් පුහුණු කිරීමේ ආයතන 8 කට හා එක් කාර්මික විශ්ව විද්‍යාලයකට ද ප්‍රකෘතිමත් කිරීමේ උපකරණ ප්‍රදානය කරණ ලදි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ උපදේශක වරයෙකු වන රොබර්ට් බර්ක්ලි මහතා ගේ ප්‍රධානත්වයෙන් ඉතකී උප කරණ භාවිතය පිළිබඳව කාර්මිකයින් හා ඉංජිනේරුවන් 240 ක් පමන පුහුණු කරණ ලදි. තවද උපකරණ නිවැරදිව භාවිතා කරණ බවට පසු විපරම් කිරීමට ද කටයුතු යොදන ලදි.

5. කාබන් ටෙට්‍රාක්ලොරයිඩ් ව්‍යාපෘතිය.

ක්‍රියාත්මක කාබන් කර්මාන්තයේ කාබන් ටෙට්‍රාක්ලෝරයිඩ් පරිභෝජනය ඉවත් කිරීම පිණිස ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කරණ ලද ව්‍යාපෘති යෝජනා ජුලි මාසයේ පැවති අරමුදලේ විධායක කමිටු රැස්වීමේදී සලකා බලා ඇත. ඩොලර් 220,000 ක් ඉල්ලා තිබුනද ක්‍රියාත්මක කාබන් වලින් වැඩි කොටසක් සංවර්ධනය වූ රටවලට අපනයනය කරණ බැවින් කමිටුව එකඟ

වුයේ ඉන් 30% පමනක් ලබාදීමටය. ශ්‍රී ලංකා රජය වෙනුවෙන් යෝජනාව ඉදිරිපත් කළ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන මෙම පිරිනැමීම පිළිනොගත් අතර තීරණයක් ගැනීම කල් තබන ලදි.

6. මෙතිල් බ්‍රෝමයිඩ් ව්‍යාපෘතිය.

සංවර්ධනය වෙමින් පවතින රටවල මෙතිල් බ්‍රෝමයිඩ් භාවිතය පාලනය හඳුන්වා දීමට මොන්ට්‍රියල් සංධානය පසුගිය සැප්තැම්බර මාසයේදී සංශෝධනය කරණ ලදි. ශ්‍රී ලංකාවේ මෙතිල් බ්‍රෝමයිඩ් භාවිතා කරණුයේ තේපැල තවාන් පසෙහි සිටින පැලවලට අහිතකර ජීවින් පාලනය කරණු සඳහාය. එහෙයින් විකල්ප ද්‍රව්‍ය හා තාක්ෂණයන් යොදා ගැනීමේ ශඛ්‍යතාවය හැදෑරීම සඳහා මුල්‍ය අධාර ලබා ගැනීමේ යෝජනාවක් සකස් කරණ ලද්දේය. අදාල අවසන් ව්‍යාපෘති ලියකියවිලි සකස් කිරීම සඳහා උපදේශක වරයෙකුගේ සහාය ලබා දෙන ලෙස ඉල්ලීමේ යෝජනාවක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන වෙත ඉදිරිපත් කරණ ලදුව ඊට ප්‍රතිචාරයක් වශයෙන් උපදේශක වරයෙකු ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකාව ට පැමිනීමට නියමිතය.

7. ශීත කරණ ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම.

ව්‍යාපෘති කාර්ය මණ්ඩලය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනේ උපදේශක බර්ට් වීනන්ඩාල් අදාල කර්මාන්ත ශාලා වෙත ගොස් ව්‍යාපෘතියේ ප්‍රගතිය පරීක්ෂා කරණ ලදි. මුල් යෝජනාවේ ආකාරයට ක්ලෝරෝ ෆ්ලුරෝ කාබන් රහිත තාක්ෂණයට මාරු වීම සඳහා ආධාර ලබා දෙන ලද කර්මාන්ත ශාල තුනෙන් එකක් වත් සතුටු දායක අන්දමින් ක්‍රියානොකරන බව මෙම පරීක්ෂණයේදී පැහැදිලි විය. මේ පිළිබඳව ව්‍යාපෘති කාර්ය මන්ඩලය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන සමග සාකච්ජා කළ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් නැවත උපදේශක වරයාගේ සේවය අප වෙත ලබා දීමට එකග වී ඇත.

8. වායු ද්‍රව ද්‍රව්‍ය ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම.

එක් වායු ද්‍රව්‍ය කර්මාන්ත ශාලාවකට එහි අවරෝධය ක්ලෝරෝෆ්ලුරෝ කාබන් වලින් හයිඩ්‍රෝ කාබන් වලට මාරු කිරීම සඳහා ආධාර ලබා දී තිබේ. එහෙත් කර්මාන්ත ශාලාව අදාල ප්‍රතිසංස් කරණ කටයුතු තවම සම්පුර්ණ කරගෙන නැත.

9. ශීතකරණ කළමනාකරණ සැලැස්ම.

ප්‍රධාන ඕසෝන් හානි කාරක ද්‍රව්‍ය භාවිතය ඇත්තේ ශීත කරණ අංශයේ බැවින්, මුළු අදියර ගත කිරීමේ අවශ්‍යතාව 2005 දීද, ක්ලෝරෝ ෆ්ලුරෝ කාබන් අවුරා තැබීමේ අවශ්‍යතාව 1999 මැද භාගයේදී ද ඉටු කිරීමට වෙළඳ හා කර්මාන්ත අංශවලට සහය වීමේ අදහසින් ශීතකරණ කළමනාකරණ සැලැස්මක් ඇති කිරීමට තීරණය කරණු ලැබ මූලික සාකච්ජා අවසන් කර ඇත.

10. විධිමත් කිරීමේ ක්‍රියාමාර්ග.

පාවිච්චි කරණ ලද ශීතකරණ උපකරණ හා ඕසෝන් හානි කාරක ද්‍රව්‍ය ආනයනය පාලනය කිරීමේ රෙගුලාසි ශ්‍රී ලංකාවේ බල පැවැත්වේ. ඒ අනුව එවැනි ආනයනයන්ට වන සම්පත් හා පරිසර අමාත්‍යාංශයේ පරිසර අංශයේ නිර්දේශය මත ආනයන හා අපනයන පාලක විසින් නිකුත් කරණ බල පත්‍ර අවශ්‍ය වේ. මෙවැනි ආනයනයන්ට ඉඩ දෙනු ලබන්නේ කළින් වසරේ එම ආනයන කරු විසින් කරණ ලද ආනයනයන්ගෙන් 90% දක්වා පමණකි. පාවිච්චි කරණ ලද උපකරණ වලට නම් අවසර දෙනු ලබන්නේ පුද්ගලික භාවිතය සඳහා වු ආනයන වලට පමණී.

පසුගිය කාලය තුළ ක්ලෝරෝ ෆ්ලුරෝ කාබන් ආනයන කරුවන් පහකටද පුද්ගලික පාවිච්චිය සඳහා පාවිච්චි කළ ශීතකරණ ආනයන කරුවන් 58 කට ද පුද්ගලික පාවිච්චිය සඳහා වායු සමීකරණ ආනයන කරුවන් 16 කට ද බලපත්‍ර නිර්දේශ කරණ ලදි. වානිජ මට්ටමින් පාවිච්චි කරණ ශීතකරණ ආනයන කිරීමට ඉදිරිපත් වු ඉල්ලීම් හතරක් ප්‍රතික්ෂේප කරණ ලදි.

11. ජාත්‍යන්තර රැස්වීම් වල සහභාගීත්වය.

සමාලෝචනය ට ලක්වන කාල සීමාව තුළදී ව්‍යාපෘති සමායෝජක පහත දැක්වෙන විදේශීය රැස්වීම් වලට ශ්‍රී ලංකා නියෝජිතයා ලෙස සහභාගී වී ඇත.

දකුණු ආසියාවේ ප්‍රාදේශීය වායු දූෂණ ප්‍රශ්ණ පිළිබඳ ප්‍රතිපත්ති සංවාදය - මාර්තු 19-20 - බැංකොක්

මොන්ට්‍රියෙල් සන්ධානය ක්‍රියාත්මක කිරීමේ බහු පාර්ශවීය අරමුදලේ විධායක කිමිටු රැස්වීම් - මාර්තු 25 -27 මොන්ට්‍රියෙල්

ඕසෝන් නිලධාරින්ගේ දකුණු ආසියා සංවිධානයේ පළමු රැස්වීම. - මැයි 12-15 නවදිල්ලි

දේශගුණ විපර්යාස පිළිබඳ කාර්ය රාමු සම්මුතියේ උපකාර්ය ආයතන රැස්වීම. - ජුනි 1-12 බොන්.

## ක්‍රියාත්මක සැලැස්ම 1999

1. ඕසෝන් හානි කාරක ද්‍රව්‍ය පිළිබඳ දත්ත රැස්කිරීම.
2. ඕසෝන් හානි කාරක ද්‍රව්‍ය පරිභෝජනය කරණ කර්මාන්ත පිළිබඳ සමීක්ෂණය.
3. ශීත කරණ කළමනාකරණ කරණය කිරීමේ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.
4. කාබන් ටෙට්‍ර ක්ලෝරයිඩ් හා මෙතිල් බ්‍රෝමයිඩ් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
5. ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
6. ක්ලෝරෝ ෆ්ලුරෝ කාබන් වලින් තොර තක්ෂණයක් පිළිබඳව කාර්මිකයින් පුහුණු කිරීම.

# ඉහළ ජලාධාර කළමනාකරණ ව්‍යාපෘතිය



## අරමුණු

1. වන රක්ෂිත වල ඇති ස්වාභාවික වනය ආරක්ෂා කිරීම සහ කෘෂි බිම්වල පාංශු ඛාදනය අවම කිරීම මගින් පහල ජල මාර්ග වල රොන්මඩ තැන්පත්වීම වලක්වා ලීම.

2. ස්වාභාවික වනය සංරක්ෂණය කිරීම හා පාංශු ඛාදනය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.

3. කෘෂි කාර්මික භෝග නිෂ්පාදීතතාව ඉහළ නැංවීම සඳහා යෝග්‍ය වගා ක්‍රම පිළිබඳ දැනුම ජනතාවට ලබා දීම.

4. ඉහළ ජලාධාර ප්‍රදේශවල වෙසෙන ජනතාව ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම

5. සහභාගීත්ව ජනතාවගේ ස්වශක්තිය ගොඩ නැංවීම

## 1998 වසරේ කාර්‍ය සාධනය

1. ව්‍යාපෘති කාර්‍යාලයක් පිහිටුවීම
   ව්‍යාපෘති කාර්යාලය පිහිටවනු ලැබ ඇති අතර, ව්‍යාපෘති අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 2 සඳහා බඳවා

ගැනීම් කොට ඇත. සමාජ සජීවීකාරකයන් බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත.

2. උපදේශක සේවා ලබා ගැනීම

ජාත්‍යන්තර ටෙන්ඩර් කැඳවීම මගින් ව්‍යාපෘතියට උපදේශක සේවා සැපයීම සඳහා ආයතනයක් තෝරා ගනු ලැබ ඇති අතර, 1998 නොවැම්බර් මස සිට උපදේශක සේවා ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කොට ඇත.

3. මිලදී ගැනීම්.

3.1. වාහන

ව්‍යාපෘතියේ පළමු වසර සඳහා ඩබල් කැබ් රථ 04ක් සහ ජීප් රථ 01ක් මිලට ගැනීම සඳහා ඇණවුම් කරනු ලැබ ඇත. මොටර් සයිකල් 36ක් මිලට ගැනීමට මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී.

3.2. උපකරණ.

ව්‍යාපෘතියේ කාර්යාල වල ප්‍රයෝජනය සඳහා අවශ්‍ය ලී බඩු හා කාර්යාල උපකරණ මිලට ගනු ලැබ ඇත. ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන රසායනාගාර උපකරණ සහ අනෙකුත් කාර්යාල උපකරණ මිලට ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබ ඇත.

4. කමිටු පිහිටුවීම.

ව්‍යාපෘතියේ කාර්යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා අනෙකුත් ආයතන වල සහය ලබා ගැනීමේ අරමුණින් අදාල ආයතන වල ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් ජාතික සම්බන්ධී කරණ කමිටුව පිහිටුවනු ලැබ ඇත.

5. ව්‍යාපෘතියේ කාර්යයන්

5.1. වන ආරක්ෂණ කලාප පිහිටුවීම

හෙක්ටයාර් 110 ක පමණ ප්‍රදේශයක සහභාගීත්ව ක්‍රමය පදනම් කොට ගෙන ගොවීන් තෝරා ගැනීමත් ආරක්ෂක කලාප පිහිටුවීමට යෝග්‍ය බිම් හඳුනාගැනීම හා වෙන් කිරීමත් කොට ඇත.

5.2. යටි වගාව

සුදුසු බිම් හඳුනාගැනීම හා මැනීම සම්පූර්ණ කොට ඇත.

5.3. දැව වගාවන්

දැව සඳහා යෝග්‍ය ශාක වගාවන් ආරක්ෂා කිරීම සඳහා ගොවීන් තෝරා ගැනීම අවසන් කොට ඇති අතර, හෙක්ටයාර් 12.8 ක ප්‍රදේශයක බිම් සකස් කෙරෙමින් පවතී.

5.4. ගෙවතු වගාව

ගෙවතු 1000 ක් සංවර්ධනය කිරීම සඳහා ගොවීන් හඳුනාගෙන වගාව සඳහා යෝග්‍ය ශාක වර්ග හඳුනා ගැනීම කොට ඇත.

5.5. ස්වාභාවික වනය මැන වෙන් කිරීම

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් පබර බොටුව ස්වාභාවික වනය මැන වෙන් කිරීම ආරම්භ කොට ඇති අතර, කි.මී. 70 ක් පමණ ප්‍රදේශයක මැනුම් කටයුතු කෙරෙමින් පවතී. වන ජීවී දෙපාර්තමේන්තුවට අයත් "පීක් විල්ඩර්නස්" වන ගහනය හඳුනාගැනීම අවසන් කොට ඇත.

## ක්‍රියාත්මක සැලැස්ම - 1999

| කාර්යය | ඉලක්ක |
|---|---|
| 1 වන ආරක්ෂණ කලාප පිහිටුවීම | - හෙක්. 250 ප්‍රදේශයක |
| 2 කුඩා දැව වශයෙන් ස්ථාපනය කිරීම | - හෙක්. 100 ප්‍රදේශයක |
| 3 ගෙවතු වගාව | - ගෙවතු 2000 ක් |
| 4 නුවර එළිය හා බදුල්ල දිස්ත්‍රික්ක වල වගා බිම් වල සංරක්ෂණ වගා ක්‍රම ඇති කිරීම | - වගා බිම් 1000 ක් |

# පරිසර ප්‍රවර්ධන ඒකකය



## 1998 වසරේ කාර්‍ය සාධනය.

මහජනතාව පරිසර කටයුතු පිළිබඳව දැනුවත් කර, පරිසර සංරක්ෂණයට හා පරිසර ප්‍රවර්ධනයට ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය ලබාගැනීම අරමුණු කරගත් ව්‍යාපෘති රාශියක් ම 1998 වසර තුළදී සැලසුම් කර ක්‍රියාත්මක කරණ ලදි. නවතම පාරිසරික විද්‍යාත්මක දැනුම් සම්භාරය ජනතාව වෙත සන්නිවේදනය කිරීම කෙරෙහි මෙහිදී විශේෂ අවධානය යොමු කරන ලද අතර, ඒ සඳහා රූපවාහිනිය හා ගුවන් විදුලිය වැනි විද්‍යුත් මාධ්‍යයන් මෙන්ම, පුවත්පත්, සඟරා වැනි මුද්‍රිත මාධ්‍යයන් ද, පාරම්පරික සන්නිවේදන විධි, පුද්ගලාන්තර සන්නිවේදනය හා කණ්ඩායම් සන්නිවේදනය ද උපයෝගී කරගන්නා ලදි.

### සම්මන්ත්‍රණ හා වැඩමුළු.

පාරිසරික කටයුතු සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ හා තරුණ කොටස් වල සහාය ලබා ගැනීමත් ඔවුන් මගින් වැඩිහිටි පරපුරේ අවධානය පාරිසරික කටයුතු කෙරේ යොමු කරවා ගැනීමත් අරමුණු කරගත් සම්මන්ත්‍රණ හා වැඩමුළු 04 ක් ප්‍රාදේශීය මට්ටමින් සංවිධානය කර පවත්වන ලදි. ලෝක මිහිතල දිනය වෙනුවෙන් මාතලේ ද, ලෝක පරිසර දිනය වෙනුවෙන් වෙන්නප්පුවේ ද පවත්වන ලද ජනාවබෝධ වැඩ සටහන් මේ අතරින් විශේෂවේ.

මීට අමතරව කැලෑ ගිනි, නාය යෑම්, වැනි ස්වාභාවික ආපදා පිළිබඳව ජනතාව දැනුවත් කර, එවැනි ආපදා වලක්වා ගැනීම සඳහා ඔවුන් උනන්දු කරවීමේ සම්මන්ත්‍රණ මාලාවක් බදුල්ල දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම ආවරණය වන අන්දමින් පවත්වන ලදි.

පසුගිය දා ශ්‍රී ලංකාවේ පවත්වන ලද හතර වැනි සාර්ක් පරිසර අමාත්‍ය රැස්වීම තේමා කොටගෙන පුවත් පත් ලිපි, පුවත් පත් අතිරේක, ගුවන් විදුලි හා රූපවාහිනී වැඩ සටහන් මගින් කළාපයේ පරිසර සහයෝගීතාව පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ පුළුල් ප්‍රචාරාත්මක වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරණ ලදි.

### පරිසර ප්‍රකාශන.

මෙම අමාත්‍යාංශයේ පරිසර ප්‍රකාශනය වන "සොබා" සඟරාව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම ප්‍රකාශයට පත්කෙරේ. පරිසර කටයුතු පිළිබඳව පළාත්පාලන ආයතන වල කාර්ය භාරය පැහැදිලි කෙරෙමින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන් ම ප්‍රකාශයට පත්කළ පරිසර අත්පොතට අමතරව පරිසර පෝස්ටර් හා පත්‍රිකා රාශියක් ද මුද්‍රණය කර මහජනයා අතර බෙදාහරින ලදි. අමාත්‍යාංශ ජෛව විවිධත්ව ඒකකයේ සහාය ඇතිව ජෛව විවිධත්ව පුවත් ප්‍රකාශනය ද මොන්ට්‍රියෙල් සන්ධාන ඒකකයේ සහාය ඇතිව ඕසෝන් පුවත් ප්‍රකාශනය ද ප්‍රවර්ධනය අංශය මගින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු යොදන ලදි.

### රූපවාහිනී හා ගුවන් විදුලි වැඩසටහන්.

ශ්‍රී ලංකා රූප වාහිනී සංස්ථාවේ හා අනිකුත් රූපවාහිනි සේවාවන් ගේත් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ හා අනිකුත් ගුවන් විදුලි සේවාවන්ගේත් සහාය ඇතිව කාලීන ප්‍රවෘත්ති ප්‍රචාරයට අමතරව, රුක් රෝපණය, නාගරික වනෝද්‍යාන, වන වගාව, වන ජීවීන්, ඕසෝන් ස්ථරය හා ජෛව විවිධත්ව වැනි කරුණු මුල් කරගෙන වාර්තා වැඩ සටහන් කිහිපයක්ම නිෂ්පාදනය කර ප්‍රචාරය කරන ලදි. මීට අමතරව කාලීන පරිසර ප්‍රවෘත්ති මුල් කරගත් සජීවී ගුවන් විදුලි වැඩසටහන් දෙකක් ද විසුරුවා හරින ලදි.

## ක්‍රියාත්මක සැලැස්ම - 1999

ඉදිරි වසරේදී පරිසර ප්‍රවර්ධනය හා සන්නිවේදනය සැලසුම් කිරීමේ දී පාරිසරික ප්‍රතිපත්ති සැකසීම හා නීති ක්‍රියාත්මක කිරීම, ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම, ජාත්‍යන්තර ගිවිසුම් සහ ප්‍රඥප්ති, ජාතික වශයෙන් සහ ජාත්‍යන්තර වශයෙන් වැදගත්වන පාරිසරික දින ( ලෝක පරිසර දිනය, ලෝක මිහිතල දිනය, ඕසෝන් දිනය, ජාත්‍යන්තර ජෛව විවිධත්ව දිනය හා රුක් රෝපණ දිනය ආදිය) 21 වැනි සියවසේ න්‍යාය පත්‍රය හා "සාර්ක්" පාරිසරික වැඩ සටහන යන අංශ පිළිබඳව ජනාවබෝධය වර්ධනය කිරීම කෙරෙහි මෙහිදී විශේෂ සැලකිල්ලක් දැක්වේ.

බොහෝ පාරිසරික ප්‍රශ්ණ විසඳා ගැනීමේ සාර්ථකම ක්‍රියාමාර්ගය ඒ පිළිබඳව ජනතාව දැනුවත් කිරීම වන හෙයින් ඉදිරි වර්ෂයේදී ද රූපවාහිනිය හා ගුවන් විදුලිය වැනි විද්‍යුත් මාධ්‍යයන් මෙන්ම පුවත්පත්, සඟරා වැනි මුද්‍රිත මාධ්‍යයන් ද පාරම්පරික සන්නිවේදන විධි, පුද්ගලාන්තර සන්නිවේදනය හා කණ්ඩායම් සන්නිවේදනය ද එහි ලා වැඩි වැඩියෙන් උපයෝගී කර ගැනීමට සැලසුම් කෙරේ.

# මධ්‍යම පරිසර අධිකාරිය


1988 දී සංශෝධනය කරණ ලද 1980 අංක 47 දරණ ජාතික පරිසර පනතේ විධි විධාන යටතේ 1981 අගෝස්තුවේ මධ්‍යම පරිසර අධිකාරිය පිහිටුවන ලදි. අධිකාරිය දැනට කෙළින්ම වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. මධ්‍යම පරිසර අධිකාරිය මූලික්ව පරිසර සංරක්ෂණය හා කලමනාකරණය කෙරෙහි උත්සුක වන ක්‍රමානුකූල කිරීමේ අධිකාරියකි.

ස්වාභාවික සම්පත් කලමනාකරණ අංශය දිවයිනේ ස්වාභාවික සම්පත් පදනම දැරිය හැකි ලෙස ප්‍රයෝජනයට ගැනීම, සංරක්ෂණය හා කලමනාකරණය පිණිස ක්‍රමෝපායයන් සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ නිරත වී සිටී.

පරිසර ආරක්ෂණ අංශය වාතය, ජලය හා පස දූෂණය පාලනය සහ කාර්මික දූෂණ පාලනයට සම්බන්ධ ක්‍රමානුකූල කිරීමේ කටයුතුවල යෙදේ.

පරිසර ප්‍රවර්ධන අංශය පාරිසරික දැනුවත් බව වර්ධනය කිරීම තුළින් පාරිසරික වැඩ සටහන් වලට ක්‍රියාකාරී ජනතා සහභාගීත්වය ලබාගැනීමෙහිලා ක්‍රියාකරයි.

# පරිසර සංරක්ෂණ අංශය



## 1998 වර්ෂයේ කාර්‍ය සාධනය.

- නව පරිසර ආරක්ෂණ බලපත්‍ර 140 ක් හා අලුත් කිරීම් 237 ක් නිකුත්කර ඇත.

- පරිසර දූෂණය හා මහජන පීඩා සම්බන්ධ පැමිණිලි 891 ක් ලැබී ඇති අතර, ඉන් 147 ක් පිළිබඳව දැනට කටයුතු කර ඇත. ඉතිරි පැමිණිලි ඒවායේ ස්වභාවය අනුව අදාල පළාත් පාලන ආයතන වෙත නිසි පියවර ගැනීමට යොමු කර ඇත.

- පළාත් පාලන ආයතනවල නිලධාරීන් 100 ක් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම හා කර්මාන්ත ස්ථානගත කිරීම සම්බන්ධව පුහුණු කිරීම කර ඇත.

- මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාරය විසින් කැළණිගඟ, නුවරවැව, මහ කොළඹ ඇල මාර්ග පද්ධතිය සහ අනෙකුත් ජලාශවල මතුපිට ජලය සහ භූගත ජලය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණ කටයුතු සිදුකර ඇත. කර්මාන්තවලින් ලබාගත් අපජලය ආදර්ශයන් ඇතුලුව ජල නියැදි 429 ක් මෙම රසායනාගාරයේ විශ්ලේෂණයට භාජනය කර ඇත.

- අවට වාතයේ තත්ත්වය මිනුම් කරනු ලබන ස්ථාවර ඒකක දෙක හා ජංගම ඒකකය භාවිතයෙන් කොළඹ නගරයේ අවට වාතයේ තත්ත්වය නොකඩවා මිනුම් කිරීම කර ඇත.

- සුළු පරිමාණ දූෂණකාරක කර්මාන්ත සම්බන්ධව ගුරු උපදෙස් මාලා නවයක කෙටුම්පත් සකස් කර ඇත.

- හානිකර අපද්‍රව්‍ය ගබඩා කිරීම, එකතු කිරීම, ප්‍රවාහනය හා බැහැරලීම සම්බන්ධ ගුරු උපදෙස් මාලා කෙටුම්පතක් සකස් කර ඇත

## ක්‍රියාත්මක සැලැස්ම -1999

පරිසර සංරක්ෂණ අංශය මගින් තවදුරටත් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමත් මහා පරිමාණ දූෂණකාරක කර්මාන්ත ස්ථානගත කිරීම සඳහා නිරවුල් සහතික නිකුත් කිරීමත්, සිදුකරනු ඇත. 1999 මුල් භාගයේදී ක්‍රියාත්මක වීමට නියමිත නව අන්තරායකාරී අපද්‍රව්‍ය පිළිබඳ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ මූලික ආයතනය මධ්‍යම පරිසර අධිකාරියයි. ඒ අනුව නම්කරනු ලබන කර්මාන්ත වලින් අන්තරායකාරී අපද්‍රව්‍ය ප්‍රශ්නය පිළිබඳව තොරතුරු රැස්කිරීම මෙම වසර තුළ ආරම්භ වනු ඇත. අන්තරායකාරී අපද්‍රව්‍ය බැහැරකිරීම සඳහා ස්ථානයක් නිර්නය කිරීමේ වැඩ කටයුතු ද ආරම්භ කරනු ඇත.

මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර මගින් කර්මාන්ත ක්‍රියාවලි සම්බන්ධයෙන් පනවනු ලබන ප්‍රමිති හා උපමාන වලට අනුව එම කර්මාන්ත ක්‍රියාත්මක වන්නේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා සිදු කරනු ලබන විධිමත් පරීක්ෂණ කටයුතු තවදුරටත් පරිසර සංරක්ෂණ අංශය විසින් සිදු කරනු ඇත. එසේ පනවනු ලබන ප්‍රමිති හා උපමාන උල්ලංඝනය කරනු ලබන කර්මාන්ත වලට එරෙහිව සුදුසු පියවරක් ගනු ඇත.

මහා පරිමාණ දූෂණ කාරක කර්මාන්ත සම්බන්ධව සිදු කරන විධිමත් පසු විපරම් සිදු කිරීමට අමතර වශයෙන් රටතුළ ප්‍රධාන ජලස්කන්ධයන්ගේ දූෂණ තත්ත්වයන් පිළිබඳ නැමියාවන් නිර්ණය කිරීමේ පරීක්ෂණ ද පැවැත්වෙනු ඇත. කොළඹ නගරයට ජලය සපයන මූලාශ්‍රය වශයෙන් ඇති කැළණි ගඟ දූෂණය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් කැළණි ගඟෙහි ජලය සම්බන්ධයෙන් දැනටමත් මාසිකව සිදු කරන පරීක්ෂණ ක්‍රියාවලිය, අප ජලය මුදාහැරීම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරමින් තවදුරටත් සිදු කෙරෙනු ඇත.

ස්ථාවර ඒකක දෙක හා ජංගම ඒකකයන් භාවිතයෙන් කොළඹ නගරයේ මෙන්ම දිවයිනේ අනෙකුත් ප්‍රදේශවල ද අවට වාතයේ තත්ත්වය නොකඩවා මිනුම් කිරීමට පියවර ගනු ඇත.

# ස්වාභාවික සම්පත් කළමනාකරණ අංශය

## 1998 වර්ෂයේ කාර්‍ය්‍ය සාධනය

### 1. පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය

සීමාලෝචනය වන කාල සීමාව තුළ ක්‍රියාවලියට භාජනය කළ මුළු ගනන පරිසරික බලපෑම් තක්සේරු කිරීම් 30 ක් හා මුලික පාරිසරික පරීක්ෂණ 32 කි.

ඊට අමතරව පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ පටිපාටිය ක්‍රමවත් කිරීමට පහත දැක්වෙන ක්‍රියා ඇරඹිනි.


### 1.1. ජාතික පරිසර පනත සංශෝධනය.

මුලික පාරිසරික පරීක්ෂණ අවශ්‍යවන ව්‍යාපෘති වෙනුවෙන් අනුගමනය කළ යුතු පටිපාටිය ලිහිල් කිරීමේ අරමුණින් ජාතික පරිසර පනතට සංශෝධනයක් යෝජනා කෙරිනි. යෝජිත සංශෝධනයේ අදහස මුලික පාරිසරික පරීක්ෂණ වාර්තා සඳහා මහජන විවේචන වලට වෙන්වූ දින 30 ක කාලය ඉවත් කිරීමයි. පරිසරයට සැලකිය යුතු බලපෑමක් සිදු නොකරන ව්‍යාපෘති වලට පමණක් මුලික පාරිසරික පරීක්ෂණ වාර්තා සීමාවන නිසා ඒවා පිළිබඳ මහජන පරීක්ෂණ හා විවේචන අනවශ්‍ය ලෙස සැලකිනි.

මහජන විවේචන වලට වෙන්වූ කාලය ඉවත් කළේ අදාල ව්‍යාපෘති පිළිබඳ ක්‍රියාවලිය ඉක්මන් කිරීම සඳහාය.

### 1.2. පාරිසරික බලපෑම් තක්සේරු රෙගුලාසි සමාලෝචනය

ජාතික පරිසර පනතට යෝජිත සංශෝධනය සැකසීමට රෙගුලාසි කෙටුම්පතක් පිළියෙල කෙරිණ. ඒ අනුව මුලික පාරිසරික පරීක්ෂණ වාර්තා සඳහා වෙන්කර තිබුණු මහජන විවේචන කාල සීමාව ඉවත්වනු ඇත. මේ රෙගුලාසි වල අරමුණ මුලික පාරිසරික පරීක්ෂණයට භාජනය වන ව්‍යාපෘතිවලට පවා මහජන සහභාගීත්වය සීමාසහිත ප්‍රමාණයකට ලබාගැනීමයි.



### 1.3. පාරිසරික බලපෑම් තක්සේරුවට අනුව නිරීක්ෂණයට යන්ත්‍රණයක් සකස් කිරීම.

පාරිසරික බලපෑම් තකසේරු අධ්‍යයනයකින් පසු ක්‍රියාත්මක කරන ව්‍යාපෘති නිරීක්ෂණය ඉතා වැදගත් සේ සැලකේ. නිරීක්ෂණ සැලැස්මක කෙටුම්පතක් සුචකයක් සමග පිළියෙළ කර කටයුතු අවසන් වෙමින් පවතී.

### 2. අත්පොත්, මාර්ගෝපදේශ සහ සංග්‍රහය පිළියෙළ කිරීම.

සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ පහත දැක්වෙන අත්පොත් සහ සංග්‍රහයන් ඒ ඒ අංශවලට අදාළ මාර්ගෝපදේශ සැපයීමට පිළියෙළ කෙරිණ.

2.1. පාරිසරික බලපෑම් තක්සේරුව පිළිබඳ විධි ශාස්ත්‍ර අඩංගු සංග්‍රහය දැන් සම්පූර්ණය. මුද්‍රණයට නියමිත ය.

2.2. ආකර කර්මාන්තය, ධීවර සහ ජලජ සම්පත් මාර්ගෝපදේශ සැකසීම දැන් අවසන්ය. මුද්‍රණයට පත් වේ. ජල සම්පාදනය සහ බලශක්ති අංශය පිළිබඳ මාර්ගෝපදේශ දැන් සංස්කරණය වෙමින් පවතී. ඉන්පසු මුද්‍රණය කෙරේ.

### 3. පුහුණු කිරීමේ වැඩ සටහන්.

සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ පුහුණු කිරීමේ වැඩ සටහන් ගණනක් ම සංවිධානය කළේය. ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම අනුව ස්වාභාවික සම්පත් කළමනාකරණය සහ ක්‍රමානුකූල කිරීමේ පරිපාටි පිළිබඳ සංවර්ධකයන් අතර සහ ඔවුන් හා සම්බන්ධ රජයේ නියෝජ්‍යායතන අතර දැනුවත් බව ඇති කිරීමට මේ සම්මන්ත්‍රණ පැවැත්වුණි.

3.1. පාරිසරික බලපෑම් තක්සේරු කිරීම පිළිබඳ දින 10 ක නියමු වැඩ සටහන. 1998 ඔක්තෝබර 01 වනදා සිට 10 වනදා දක්වා පොල්ගොල්ලේ සමුපකාර පුහුණු ආයතනයෙහි දින 10 ක පාරිසරික බලපෑම් තක්සේරු කිරීම පිළිබ නේවාසික වැඩ මුළුවක් පැවැත්විණ. රජයේ ආයතන, විශ්ව විද්‍යාල, පෞද්ගලික සහ රජයේ නොවන

සංවිධානවල නියෝජිතයෝ 40 ක් එයට සහභාගී වූහ.

3.2. සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ ආයෝජකයන් අතර දැනුවත් බව ඇති කිරීමේ අරමුණින් පහත දැක්වෙන දැනුවත් කිරීමේ වැඩමුළු සම්පූර්ණ කැරිණ.

1998 මාර්තු - රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ නොවන සංවිධාන සඳහා පාරිසරික බලපෑම් තක්සේරු කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන.

1998 අප්‍රේල් - විදුලි සංදේශ ඔපරේටවරුන් දැනුවත් කිරීමේ වැඩමුළුව.

1998 මැයි - ආයෝජකයන් සඳහා පාරිසරික බලපෑම් තක්සේරු කිරීම සහ පරිසර ආරක්ෂණ බලපත්‍ර පටිපාටි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන.

1998 ජූනි - මධ්‍යම පරිසර අධිකාරිය ස්වාභාවික සම්පත් කළමනාකරණය පිණිස පිළියෙල කළ මාර්ගෝපදේශ පිළිබඳ පළාත් සභා නියෝජිතයන්, පළාත් සභා නිලධාරීන් සහ ප්‍රාදේශීය ලේකම් වරුන් දැනුවත් කිරීමේ පුහුණු වැඩ සටහන.

## 4. විශේෂ ව්‍යාපෘති:

(අ) පාරිසරික තක්සේරු ව්‍යාපෘතිය සඳහා ආයතන ශක්තිමත් කිරීම.
මේ කාල සීමාවෙහිදී පාරිසරික තක්සේරු ව්‍යාපෘතිය ආයතනිකව ආසියානු සංවර්ධන බැංකුවේ ආධාරයෙන් ශක්තිමත් කිරීමට මේ අංශය උපකාරී විය.

මේ ව්‍යාපෘතිය මඟින් පහත දැක්වෙන දෑ ඉටුකර ගැණින.

පාරිසරික බලපෑම් තකසේරුව ක්‍රමවත් කිරීමට නිර්දේශ කිහිපයක් යොදා ගැණින.

පරිගණක පදනම් වූ පාරිසරික බලපෑම් තක්සේරු තොරතුරු සපයන ක්‍රමයක් සංවර්ධනය කර පිහිටුවන ලදී.

"පාරිසරික බලපෑම් තක්සේරුව පිළිබඳ ලිහිල් ප්‍රශ්න සහ උත්තර" නම් කුඩා පොතක් තොරතුරු සැපැයීමට පිළියෙළ කෙරිණ.

මීට අමතරව පාරිසරික සහායකයන් දහයක් පුහුණු කර පසුව අමාත්‍යාංශවලට අනුයුක්ත කෙරිණ.

(ආ) භූගෝලීය තොරතුරු ක්‍රමය යටතේ පාරිසරික වශයෙන් සංවේදී පෙදෙස් සිතියම් ගත කිරීම.

පාරිසරික වශයෙන් සංවේදී පෙදෙස් සිතියම් ගත කිරීමට දත්ත පදනමක් සැකසීමට මූලික කටයුතු ඇරැඹුණි. පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරුව ක්‍රියාත්මක කිරීමේදී සංවර්ධකයන් වියහැකි අයට සහ ව්‍යාපෘති අනුමත කරන ඒජන්සිවලට දත්ත පදනම උපකාර වනු ඇත. දත්ත පදනම දකුණු පළාතේ වර්ධනය කැරේ. සමාලෝචනය වන කාලසීමාව තුළ අදාල ඒජන්සිවලින් තොරතුරු එක්රැස් කෙරිණ.

(ඇ) ඒකීකරණීය සම්පත් කලමනාකරණ වැඩ සටහන.
සමාලෝචනය වන කාලසීමාව තුළ ඉහත සඳහන් ව්‍යාපෘතිය යටතේ පහත දැක්වෙන කටයුතුවල යෙදින.

සමෘද්ධි අධිකාරිය, වෙළඳ මණ්ඩල සංයුක්තය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ රජයේ නොවන සංවිධාන සමග සම්බන්ධීකරණය. ඊට අමතරව ස්වභාවික සම්පත් කළමනාකරණ අංශය සහ මුතුරාජවෙල කළමනාකරණ කමිටුව ශක්තිකමත් කිරීමට පියවර ගැණින.

මේ ක්‍රියාකාරකම යටතේ මුතුරාජවෙල පෙදෙසේ සමාජ ආර්ථික මූලික අධ්‍යයනයක් කිරීමට බාර ගැණින.

ඊට අමතරව මුතුරාජවෙල ගෙවතු වගාව, උයන් වගාව, සත්ව පාලනය සහ වන වගා නියමු ව්‍යාපෘති අරඹා ක්‍රියාත්මක වෙමින් පවතී. කාන්තාවන් සඳහා ස්වයං රැකියා කටයුතු ද ඇරැඹිණ.

ජෛව විවිධත්ව සහ පාරිසරික විවිධත්ව ආරක්ෂණයට ව්‍යාපෘති පෙදෙසේ දූෂණය සහ තෙත් බිම්වල සම්පත් ඒකීකරණීය කළමනාකරණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වා ගෙන යනු ලැබේ. දත්ත පදනමක් ක්‍රමානුකූලව සකසා තිබේ.

අමුත්තන් සඳහා මුතුරාජවෙල පවත්වන මධ්‍යස්ථානය පිළිබඳ පෞද්ගලීකරණ ක්‍රියාවලිය පවත්වා ගෙන යන අතර, සමාගමේ ව්‍යවස්ථා පිළියෙල කිරීම අවසන් වෙමින් පවතී.

## ක්‍රියාත්මක සැලැස්ම -1999

නියමිත ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම තක්සේරු කිරීමේ පටිපාටිය ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය හා සම්බන්ධ නියමු වැඩ සටහන් ස්වාභාවික සම්පත් කළමනාකරණ

අංශය විසින් පවත්වා ගෙන යනු ඇත.

- ✳ නියමිත ව්‍යාපෘති පිළිබඳ අනුමත කිරීමේ පටිපාටිය ක්‍රියාත්මක කිරීම සඳහා පාරිසරික බලපෑම් තක්සේරුව ක්‍රියාත්මක කිරීම පිළිබඳ පියවර ගැනීමට කටයුතු යෙදීම.

- ✳ මූලික පාරිසරික පරීක්ෂණ පිළිබඳ දත්ත පරිගණක ගතකර පවත්වා ගෙන යාම අඛණ්ඩව සිදුකර ඇති අතර, ඉදිරියේදී එය යාවත් කාලීන කෙරේ.

- ✳ ස්වාභාවික සම්පත් කළමනාකරණ අංශයට අදාළ මාර්ගෝපදේශ මුද්‍රණය කර බෙදා හැරීම.

- ✳ පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශ සිතියම් ගත කිරීමේ ක්‍රියාවලිය දිගටම පවත්වාගෙන යාම.

- ✳ මූලික පාරිසරික පරීක්ෂණ නිරීක්ෂණය කිරීමේ සැලැස්ම සම්පූර්ණ කිරීම.

- ✳ මූලික පාරිසරික පරීක්ෂණ හා පාරිසරික බලපෑම් අගැයීම යටතේ අනුමත කරනු ලැබූ ව්‍යාපෘති නිරීක්ෂණය කිරීමට පියවර ගැනීම.


- ✳ අයෝජකයන් හා සංවර්ධකයන් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම.

- ✳ දැනටමත් ප්‍රකාශයට පත්කර ඇති දිස්ත්‍රික් පාරිසරික පැතිකඩ යාවත් කාලීන කිරීම.

- ✳ සමෘද්ධි අධිකාරිය, වෙළඳ මණ්ඩලය, රජයේ නොවන සංවිධාන සහ වෙනත් අදාළ නියෝජ්‍යායතන සම්බන්ධීකරණය.

- ✳ දැනට පවත්වා ගෙන යන නියමු ව්‍යාපෘති ව්‍යාප්ත කිරීම සහ නව ව්‍යාපෘති හඳුනා ගැනීම. ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් ශක්තිමත් කිරීම හා දත්ත පදනම පුළුල් කිරීම.

# පරිසර ප්‍රවර්ධන අංශය



## 1998 වසරේ කාර්‍ය සාධනය

### 1. පරිසර අධ්‍යාපන වැඩසටහන්

1998 සැලසුම් අනුව පරිසර අධ්‍යාපනය පාසල් ළමුන් කරා ගෙන යාම හා නොවිධිමත් අධ්‍යාපනික ක්‍රම උපයෝගී කරගනිමින් සිසුන්ගේ පරිසර අධ්‍යාපනික ආකල්ප, හා කුසලතා වර්ධනයට වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

පරිසර නියමු භට කණ්ඩායම් වැඩසටහන පාසල් 6000 කට හඳුන්වාදීමේ පළමු අදියර යටතේ පාසල් 2000 ක් තෝරා ගැනීමේ කටයුතු අවසන් කරන ලදි. පරිසර නියමු භට කණ්ඩායම් වැඩසටහන යටතේ පාසල් 50 කට වැඩසටහන හඳුන්වාදීමත්, අදාළ ගුරු හා නායක සිසු පුහුණු වැඩසටහන් 17 ක් දිස්ත්‍රික්ක මට්ටමින් පැවැත්වීමත් කරන ලද අතර, ජාතික මට්ටමින් එක් වැඩ සටහනක් ද පවත්වන ලදි.

පාසල් සිසුන් 350 ක සහභාගීත්වය ඇතිව පරිසර ජම්බෝරියක් රන්දෙණිගල පවත්වන ලදි. සිසුන් ප්‍රායෝගිකව පාරිසරික ක්‍රියාකාරකම් සඳහා යොමු කිරීමේ පරිසර ව්‍යාපෘති 48 ක් තෝරා ගත් පාසල් තුළ ක්‍රියාත්මක කරන ලදි.

පරිසර සමිති වැඩසටහන යටතේ පාසල් 200 ක් තුළ එම වැඩසටහන ව්‍යාප්ත කරන ලදි.

ලෝක පරිසර දිනය සැමරීමේ වැඩසටහන යටතේ සිසුන්ගේ පරිසර දැනුම වර්ධනය කිරීමේ දිස්ත්‍රික්ක මට්ටමේ වැඩසටහන් 18 ක්, සහ ජාතික මට්ටමේ වැඩසටහනක් ද පවත්වන ලදි.

පාසල් මට්ටමින් ප්‍රදර්ශන 25 ක් පැවැත්වීමෙන් ළමුන්ගේ පරිසර දැනුම වර්ධනයට කටයුතු කර ඇත. ජනපති පොදුජන සේවා වැඩසටහන යටතේ පාසල් දරුවන්ගේ දැනුම වර්ධනයට සම්මන්ත්‍රණ 03 ක් පවත්වන ලදි. ඊට අමතරව සම්පත්දායකයින් ලබාදීම පාසල් මට්ටමින් සිදු විය.

### 2. පරිසර අවබෝධ වැඩසටහන්

බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා භූමියේ පැවති 50 වැනි නිදහස් සමරු උළෙල වෙනුවෙන් අධ්‍යාපනික ප්‍රදර්ශනයක්, ප්‍රදර්ශන රථයක් හා දිස්ත්‍රික්ක මට්ටමේ නිදහස් සමරු ප්‍රදර්ශන කුටි 3 ක් මහපොළ ප්‍රදර්ශන කුටි 04 ක් ද පවත්වන ලදි.

පාසල් ළමුන්ගේ සහභාගීත්වය ඇතිව නගර සීමා තුළ පවතින බරපතල පාරිසරික ප්‍රශ්නයක් වන වාහනවලින් වන වායු දූෂණය පිළිබඳව ජනතා අවබෝධය ඇති කිරීමෙහි ලා පාසල් සිසුන් 450 ක ද, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල ද සහභාගීත්වය ඇතිව පරිසර පා ගමනක් කොළඹ නගරය තුළ පවත්වන ලදි.

රුක් රෝපණ වැඩසටහන් යටතේ පැළ තවාන් 23 ක් දිස්ත්‍රික්ක 17 ක ඇති කිරීමට ද, රාජ්‍ය නොවන සංවිධාන හා පාසල් සම්බන්ධීකරණය තුළින්, ගංගා ඉවුරුවල රුක් රෝපණයට ද කටයුතු කෙරිණ.

රාජ්‍ය නොවන සංවිධාන මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි කිරීම යටතේ සංවිධාන 78 ක් ලියාපදිංචි කරන ලදි.

රාජ්‍ය නොවන ආයතන සමග සමීප පාරිසරික සම්බන්ධතාව තුළින් දිස්ත්‍රික් පාරිසරික ගැටළු හඳුනා ගැනීම සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් පාරිසරික රාජ්‍ය නොවන ආයතනවල ඒකක පිහිටුවීමට කටයුතු කළ අතර ඒ යටතේ දිස්ත්‍රික්ක 13 ක දැනට එම ඒකක ක්‍රියාත්මක වේ.

පරිසර සංවර්ධන සහකාරවරුන් මෙහෙයවීම තුළින් ප්‍රාදේශීය මට්ටමින් පරිසර විෂයට සම්බන්ධ පාසල් වැඩසටහන් සහ රුක්රෝපණ, ප්‍රතිචක්‍රීයකරණ, ප්‍රදර්ශන, විශේෂ පරිසර දින ආදී වැඩසටහන් 7754 ක් මහජන සහභාගීත්වය සඳහා ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

### 3. ප්‍රචාරක හා පුවත්

පත්‍රිකා 13 ක් විවිධ විෂයයන් යටතේ මුද්‍රණය කර බෙදා හැර ඇත. ප්‍රාදේශීය මට්ටමේ පාරිසරික ප්‍රශ්න ඉලක්ක කර ගත් පත්‍රිකා 23 ක් ද මුද්‍රණය කර බෙදා හැරීමට කටයුතු කර ඇත. පරිසර දැනුම අවබෝධය සඳහා පරිසර පුවත් භාෂා තුනෙන්ම කාර්තුවකට එක බැගින් මුද්‍රණය කර දිවයින පුරා විවිධ

ආයතනවලට බෙදා හරින ලදී.

කෙටි රූපවාහිනී දැන්වීම් තුනක් වායු දූෂණය, කැළිකසළ, හා ශබ්ද දූෂණය පිළිබඳව නිෂ්පාදනය කිරීමට ද රූපවාහිනී ඔස්සේ ප්‍රචාරය කිරීමට ද කටයුතු කෙරිණ.

පුවත්පත්වල පරිසර ලිපි 25 ක් පළ කරනු ලැබිණ. සඟරා සහ පුවත්පත්වලට පරිසර දැන්වීම් 09 ක් ලබාදීම තුළින් පාරිසරික පණිවුඩය ජනතාව වෙත යොමු කරනු ලැබිණ.

පුස්තකාලය හා ප්‍රවෘත්ති සැපයීමේ වැඩසටහන යටතේ ඉන්ගොටෙරා ජාත්‍යන්තර පරිසර ජාලය මගින් විදේශීය පුස්තකාල ජාල 05 ක් අතර තොරතුරු හුවමාරු කෙරිණ.

පුස්තකාල පරිසරය හා තොරතුරු විමසීම් 820 ක් ද, පොත් විකිණීම් 570 ක් ද කරනු ලැබ ඇත. පාරිසරික තොරතුරු දත්ත පද්ධති 05 ක් පවත්වා ගෙන යනු ලැබිණ.

## ක්‍රියාත්මක සැලැස්ම -1999

පාරිසරික ගැටළු පිළිබඳව පාසල් දරුවන් හා වැඩිහිටි ජනතාව තුළ සංවේදීතාව ඇති කිරීම සඳහා ජනමාධ්‍ය සහ විවිධ ක්‍රමවේද තුළින් පාරිසරික සංරක්ෂණ ක්‍රියාකාරකම් වලට ඔවුන් යොමු කිරීමේ අරමුණින් පහත සඳහන් වැඩසටහන් සැලසුම් කර ඇත.

- පරිසර නියමු භට කණ්ඩායම් වැඩසටහන් පාසල් 2000 ක් තුළ ව්‍යාප්ත කිරීම සහ ඒ අනුව අදාළ අනෙකුත් ක්‍රියාකාරකම්
- පරිසර අධ්‍යාපනය පෙර පාසල් හා ප්‍රාථමික මට්ටමින් ශක්තිමත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ඇත.
- පාසල් හැරයන්නවුන්ට පරිසර අධ්‍යාපන සහතික පාඨමාලාවක් ක්‍රියාත්මක කරනු ඇත.
- ප්‍රාදේශීය හා දිස්ත්‍රික්ක මට්ටමේ රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.
- ලෝක පරිසර දිනය හා මිහිතල දිනයට අදාළව විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ඇත.
- පරිසර ප්‍රදර්ශන පැවැත්වීම.
- තමා ජීවත් වන නිවස තුළ පරිසරය රැකීමේ දී කාන්තාවන්ගේ වගකීම ශක්තිමත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.
- දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය නොවන ආයතන ඒකක සමග වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරේ.
- පරිසර සංවර්ධන සහකාරවරුන් තුළින් ප්‍රාදේශීය මට්ටමේ පාරිසරික සම්පත් කළමනාකරණය හා ජනාවබෝධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.
- ජනතා අවබෝධය සඳහා පරිසර චිත්‍රපට නිෂ්පාදනය හා ප්‍රචාරය ද ගුවන් විදුලි වැඩසටහන් ප්‍රචාරය ද කෙරේ.

*Printed at the NAITA Press*

R